# වාර්ෂික වාර්තාව

# வருடாந்த அறிக்கை


# Annual Report

# 2012









ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය

இலங்கை மலையக அபிவிருத்தி அதிகார சபை

Udarata Development Authority of Sri Lanka

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

பொருளாதார அபிவிருத்தி அமைச்சு

Ministry of Economic Development

# වාර්ෂික වාර්තාව

# வருடாந்த அறிக்கை

# Annual Report

# 2012

# පටුන

පිටුව


| | | |
|---|---|---|
| 1. | දැක්ම සහ මෙහෙවර | 01 |
| 2. | සභාපතිතුමාගේ පණිවිඩය | 02 |
| 3. | අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | 05 |
| 4. | හැඳින්වීම හා ඓතිහාසික පසුබිම | 06 |
| 5. | කළමනාකරණ මණ්ඩලය | 12 |
| 6. | අරමුණු හා පරමාර්ථ | 15 |
| 7. | සංවිධාන ව්‍යුහය හා කාර්ය මණ්ඩලය | 16 |
| 8. | පාලන අංශය | 19 |
| 9. | මූල්‍ය කළමනාකරණ අංශය | 21 |
| 10. | සංවර්ධන අංශය | 27 |
| 11. | පශු සම්පත් සංවර්ධන වැඩසටහන | 38 |
| 12. | ඉංජිනේරු අංශය | 41 |
| 13 | විගණකාධිපති වාර්තාව | 49 |



## දැක්ම

අභිමානයෙන් හා සෞභාග්‍යයෙන් සපිරි උඩරට දේශයක් .



## මෙහෙවර

උඩරට ප්‍රදේශයේ ජනතාවගේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා වැඩසටහන් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය හා මෙහෙයවීම.

# සභාපතිතුමාගේ පණිවිඩය



2005 අංක 26 දරණ ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරි පනත යටතේ ස්ථාපිත කරන ලද මෙම අධිකාරිය. 2006 වර්ෂයේ මාර්තු මස සිට ක්‍රියාත්මක කර ඇති අප අධිකාරියේ අනුමත බල ප්‍රදේශයේ පදිංචි ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීමත් ඔවුන් දරිද්‍රතාවයෙන් මුදා ගැනීමත් අපගේ මූලික වගකීම වී ඇත. එයට අනුව, යටිතල පහසුකම්, ජීවනෝපාය හා ආධ්‍යාත්මික සංවර්ධනය යන ප්‍රධාන සංරචක 03 මූලික කරගනිමින් උඩරට ප්‍රදේශයේ ජනතාවගේ සමාජීය, ආර්ථික හා සංස්කෘතික සංවර්ධනය උදෙසා වැඩසටහන් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය හා මෙහෙයවීම අපගේ මූලික කාර්යභාරය බව හඳුන්වාදිය හැකිය.

අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා 2005 ජනාධිපතිවරණයෙන් පත් වීමෙන් පසු 2006 වසරේ සිට ආරම්භ කරන ලද මෙම අධිකාරිය උඩරට ජනතාවගේ ඉහත කී පරමාර්ථයන් ඉටු කිරීම සඳහා ඉතා වැදගත් සංවර්ධන ක්‍රියාදාමයන් රැසක් ආරම්භ කොට නිමා කර ඇත.

2012 වර්ෂය වන විට අප අධිකාරිය ආරම්භ කර වසර 6 ක් ගතවී ඇති අතර, එකී වසර 6 පුරාම අප අධිකාරියට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙමින් අප බල ප්‍රදේශයේ ජීවත් වන ජනතාවගේ ඉහත කී අවශ්‍යතා සපුරා දීම සඳහා රු.මි. 1750 ක මුදල් ප්‍රමාණයක් අතිගරු ජනාධිපතිතුමා විසින් අප වෙත ලබා දී ඇති බව මෙහිලා විශේෂයෙන් සඳහන් කරමි. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තන ප්‍රකාශයේ සඳහන් කරන ලද සමෘද්ධිමත් ගමක් ගොඩනැංවීමේ අභිප්‍රායෙන් ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ මෙහෙයවීම යටතේ නව ගම්මාන සංවර්ධනයේ එක් පියවරක් ලෙස හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නාරංගස්පිටිය ගම්මානය ආදර්ශ ගමක් බවට පත් කිරීමට ප්‍රථමයෙන්ම කටයුතු කර ඇත.

අතිගරු ජනාධිපතිතුමාගේ ඉහත කී සංකල්පය යටතේ ග්‍රාමීය ජනතාවගේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ඉහත කී කාල පරිච්ඡේදය තුළ අති මහත් සංවර්ධන ක්‍රියාවලියක් ආරම්භ කර ඇත. අතිශයින් දුෂ්කර උඩරට ප්‍රදේශ වල තිබූ මාර්ග අපහසුකම මගහැරවීම සඳහා නාරංගස්පිටිය වීවල පාළම හා පිවිසුම් මාර්ගය, අකුරණ උඩවැලිකැටිය පාළම හා පිවිසුම් මාර්ගය, උඩුනුවර හොරේකොටේ මාර්ගය ඇතුළු, මාර්ග රැසක ඉදිකිරීම් අවසන් කර ඇත. එමෙන්ම ජනතාවගේ සමාජීය සංවර්ධන කටයුතු සඳහා කොත්මලේ මාවෙල ප්‍රජා ශාලාව, නව තිස්පනේ බහු කාර්ය ගොඩනැගිල්ල සහ

කොත්මලේ මල්ලන්ද බහු කාර්ය ගොඩනැගිල්ල ඉදිකර අවසන් කර ඇති අතර, ඒවා අදාළ ප්‍රාදේශීය ආයතන වලට භාරදීම සිදුකර ඇත.

එමෙන්ම ජනතාවගේ සෞඛ්‍ය පහසුකම් නැංවීම සඳහා ගලගෙදර නගරයේ පොදු වැසිකිළි පද්ධතිය ද කඩුගන්නාව නගරයේ පොදු වැසිකිළි පද්ධතිය ද ඉදිකර අදාළ ප්‍රාදේශීය ආයතන වලට භාර දී ඇති අතර, හතරලියද්ද, ගලගෙදර, හාරිස්පත්තුව, පූජාපිටිය හා අකුරණ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි සනීපාරක්ෂක පහසුකම් නොතිබූ පවුල් 414 කට අදාළ පහසුකම් ලබා දීමට පියවර ගෙන ඇත.

2012 වර්ෂයේදී අධිකාරියේ විශේෂ අවධානය යොමු වී ඇත්තේ ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය ඉලක්ක කර ගත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහාය. එහිලා විශේෂයෙන්ම කෘෂිකර්මයට මුල් තැනක් දී ඇති පුරන් කුඹුරු යළි අස්වැද්දීමේ වැඩසටහන යටතේ සුළු වාරිමාර්ග හා කෘෂි මාර්ග පිළිවෙලින් 72 ක් හා 101 ක් ක්‍රියාත්මක කර ඇත. පුරන්කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන යටතේ ජාතික ආර්ථික ක්‍රියාවලියට වී නිෂ්පාදනය මගින් අතිරේක ආදායම් ලැබීමට ඉතා විශේෂිත වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදි මෙමගින් ජලය නොමැතිව වගා කිරීමට නොහැකිව තිබූ පුරන් කුඹුරු රාශියක් යළි අස්වැද්දීමට පියවර ගෙන ඇති අතර, කෘෂි නිෂ්පාදන ප්‍රවාහනය කිරීම සඳහා කෘෂි මාර්ග වලින් මහත් පිටුවහලක් ලබා ගන්නා ලදි.

ග්‍රාමීය ජනතාවගේ ආදායම් උත්පාදනය වැඩිදියුණු කිරීම, පෝෂණය ඉහළ නැංවීම අරමුණු කරගත් සත්ව පාලන වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත. මේ යටතේ ඉහත කී බල ප්‍රදේශය තුළ පශු සම්පත් වැඩසටහන් ආරම්භ කරන ලද අතර, මෙහිලා සුදුසු ප්‍රතිලාභීන් තෝරාගෙන කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා උසස් ආරේ කිරි ගවයන් බෙදා දෙන ලද අතර, නිසි ප්‍රමිතියෙන් යුතු ගවගාල් ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන මෙන්ම නව තාක්ෂණයෙන් යුත් පුහුණුවීම් පාඨමාලාවක් ද පවත්වන ලදි. එමෙන්ම මෙම ප්‍රදේශ වලට යෝග්‍ය වන සත්ත්ව පාලන වැඩසටහනක් වන එළු පාලනය ප්‍රචලිත කිරීම සඳහා සුදුසු ගොවි පවුල් තෝරාගෙන එළුවන් බෙදා දීම කර ඇති අතර, එමගින් ගොවි ජනතාවගේ ආදායම මෙන්ම පෝෂණයට ද මහත් පිටුවහලක් ලබා දී ඇත. එමෙන්ම ගොවි ජනතාවගේ ආදායම් වැඩිකර ගැනීමත් පෝෂණය සඳහාත් ගෘහාශ්‍රිත කුකුළු පාලනය සඳහා කුකුල් පැටවුන් බෙදා දීමේ ව්‍යාපෘතියක් ක්‍රියාවට නංවා ඇත.

යටිතල පහසුකම් හා ජීවනෝපාය සංවර්ධනයට අමතරව ජනතාවගේ ආධ්‍යාත්මික කටයුතු සංවර්ධනය කිරීම සඳහා ද විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. එහිලා දහම් පාසැල් සංවර්ධනය කිරීම හා අවශ්‍යතා මත එම පාසැල් වලට අවශ්‍ය සියලුම ආම්පන්න සැපයීම ද, පරිගණක පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කිරීම හා එමගින් ග්‍රාමීය දරු දැරියන්ගේ තාක්ෂණය වැඩිදියුණු කිරීමට ද පියවර ගෙන ඇත.

මේ අයුරින් 2012 වර්ෂයේදී ඉහත කී සංරචක ඔස්සේ අපේක්ෂිත සංවර්ධන ඉලක්ක සපුරා ගනිමින් ජාතික සංවර්ධනයට ඉවහල් වන සංවර්ධන ව්‍යාපෘති රැසක් සාර්ථකව නිම කිරීමේදී අප අමාත්‍යාංශය භාර ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාද එමෙන්ම අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය ද අප අධිකාරියේ සමස්ථ කාර්ය මණ්ඩලය ද අදාළ කොට්ඨාශ වල රේඛීය ආමාත්‍යාංශයන්හී සියලුම කාර්ය මණ්ඩල ද එමෙන්ම මධ්‍යම පළාත් සියලුම අමාත්‍යාංශ වල කාර්ය මණ්ඩල ද දෙන ලද සහාය මෙහිලා ගෞරවයෙන් සිහිපත් කරමි.

අමරනන්ද වීරසිංහ
සභාපති

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය



යටත්විජිත ආධිපත්‍යයට නතුවූ උඩරට ප්‍රදේශයෙහි ජනතාවට සිදුවූ සමාජ ආර්ථික හා වෙනත් විවිධ දුෂ්කරතාවයන්ට තිරසාර විසඳුම් ලබාදීමටත් එම ප්‍රදේශයේ සංවර්ධනය කඩිනම් කර වේගවත් සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ ඇතිව පිහිටුවන ලද ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ ගමන් මගෙහි සයවන වසර වන 2012 වසරේ දී සංවර්ධන ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරන ලදි. අධිකාරිය සතු සම්පත් මෙන්ම ප්‍රාදේශීයව පවත්නා සම්පත් හා විභවයන් හඳුනා ගනිමින් ඒවා හැකි උපරිමයෙන් උපයෝගී කරගනිමින් ඉතා පුළුල් දැක්මක් සහිතව විවිධ සංවර්ධන වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඉතා ඉහළ ප්‍රතිඵල ළඟාකර ගැනීමට සමත් විය.

ඒ අනුව විශේෂයෙන්ම ජීවනෝපාය සංවර්ධනය ඉලක්ක කරගනිමින් බල ප්‍රදේශයට අයත් එක් එක් ප්‍රදේශයන්හි පවත්නා අවස්ථා, ගැටලු මෙන්ම පසුගාමී අංශ, ප්‍රතිලාභී කණ්ඩායම්, සමිති සංවිධාන පිළිබඳව විශේෂයෙන් සලකා බලා සංවර්ධන වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලැබිය.

මෙම සංවර්ධන ක්‍රියාවලිය මඟින් 2012 වසරේ රටේ ප්‍රමුඛ සංවර්ධන වැඩසටහන වන ''දිවි නැගුම'' වැඩසටහනට ප්‍රමුඛත්වය දෙමින් ප්‍රජාවගේ සමාජ ආර්ථික, ජීවන තත්ත්වය උසස් කිරීමට සෘජුව හා වක්‍රව ඉවහල් වන ග්‍රාමීය මට්ටමේ හඳුනාගත් ව්‍යාපෘති රැසක් ක්‍රියාවට නංවනු ලැබිය. එහිදී ග්‍රාමීය සුළු වාරිමාර්ග හා කෘෂි මාර්ග සංවර්ධනය, කිරිගව පාලනය, එළු පාලනය, කුකුළු පාලනය වැනි ව්‍යාපෘති විශේෂයෙන් හැඳින්විය හැකිය.

පුද්ගලයාගේ අධ්‍යාත්මික සංවර්ධනයට විශේෂ ස්ථානයක් ලබා දෙමින් නව දහම් පාසල් ආරම්භය හා පවත්නා දහම් පාසැල් සංවර්ධනය, පෙර පාසැල් සංවර්ධනය, මතට තිත මත් නිවාරණ වැඩසටහන්, කලායතන සංවර්ධනය, ආකල්ප සංවර්ධන වැඩසටහන්, නායකත්ව පුහුණු වැඩසටහන් හා ජීවනෝපාය සංවර්ධනය යන ව්‍යාපෘතීන් රැසක් ඉතා අර්ථවත් හා ඵලදායී ලෙසින් ක්‍රියාත්මක කරන ලදි.

එමෙන්ම දිස්ත්‍රික්ක අටකින් සමන්විත අධිකාරි බල ප්‍රදේශය තුළ මීට ඉහත 2009 - 2010 වර්ෂවල ආරම්භ කර ක්‍රියාත්මක කරන ලද නමුත් වැඩ නිම නොකරන ලද විවිධ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව අධ්‍යයනය කර සංවර්ධන ව්‍යාපෘතිවල ඉතිරි කටයුතු 2012 වසරේ දී නිම කිරීමට කටයුතු කරන ලදි.

ඒ අනුව මෙම අධිකාරිය පිහිටුවීමේ පරමාර්ථය වන ප්‍රාදේශීය සංවර්ධනය වඩා වේගවත් කර ග්‍රාමීය ප්‍රදේශවල කඩිනම් සංවර්ධනයක් සඳහා ඉතා සංවිධානාත්මකව හා කාර්යක්ෂමව මැදිහත් වී උඩරට ජනතාවට නවෝදයක් ඇති කිරීමට ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය 2012 වසරේ ද සිය මෙහෙවර ක්‍රියාත්මක කරන ලදි.

එස් එම් එස් පී සමරකෝන්
අධ්‍යක්ෂ ජනරාල්

# හැඳින්වීම හා ඓතිහාසික පසුබිම

බ්‍රිතාන්‍යයන් විසින් ක්‍රි. ව. 1815 දී උඩරට ප්‍රදේශ අත්පත් කර ගැනීමෙන් පසු පාරම්පරික උඩරැටියන් විසින් ඉමහත් පරිශ්‍රමයක් දරා ආරක්ෂා කරගත් සිය අනන්‍යතාවය කෙමෙන් ගිලිහී යාමේ තර්ජනයට ලක්විය. විශේෂයෙන් ක්‍රි. ව. 1815, 1848 කැරලි මර්දනය කිරීම පිණිස ඉංග්‍රීසීන් ගෙන ගිය ප්‍රතිපත්තිය මෙන්ම බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසින් ඉදිරිපත් කරන ලද රජයේ ඉඩම් ආඥා පනත, මුඩුබිම් පනත, අනවසර පදිංචිය වළක්වාලීමේ පනත, ඉඩම් සංවර්ධන ආඥා පනත වැනි පනත් උඩරට ගැමියන් දිළින්දන් බවට පත් කර ඔවුන්ගේ ස්වයංපෝෂිත ආර්ථිකය විනාශ කිරීමට ඉවහල් විය. විශේෂයෙන් 1840 අංක 12 දරණ මුඩුබිම් පනත සම්මත වීමත් සමගම ගැමියන්ට ඉඩම් සඳහා සිය අයිතිය සනාථ කිරීමට ඔප්පු තිරප්පු ඉදිරිපත් කිරීමට සිදුවිය. සාම්ප්‍රදායික සිරිත් විරිත් යටතේ උඩරට ගැමියන් දීර්ඝ කාලයක් තිස්සේ භුක්ති විඳි හේන් ඉඩම් විශාල ප්‍රමාණයක් මේ හේතුවෙන් ඔවුනට අහිමි විය.

උඩරට ගැමියන් කෙරෙහි බලපෑම් ඇති කළ බ්‍රිතාන්‍ය පාලනයේ තවත් අංශයක් වූයේ ධාන්‍ය බද්දයි. ධාන්‍ය බදු නොගෙවන ඉඩම් අත්පත් කරගෙන වෙන්දේසියේ විකිණීමට 1866 අංක 5 දරණ ආඥාපනතකින් ආණ්ඩුව බලය පවරා ගන්නා ලදි. කෝපි වගාව පරිහානියට පත් වූ අවධියේ සිට මෙම නීතිය දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම හේතුවෙන් බදු ගෙවීමට නොහැකි වූ ගොවීන් සතු ඉඩම් විශාල වශයෙන් රාජසන්තක විය. එසේම උඩරට වැසියා සහ උඩරට ප්‍රදේශ හැඳින්වීම දුර්වලකොට ක්ෂයවීමට ඉඩහැර කුඩා අභ්‍යන්තර මධ්‍ය ප්‍රදේශය කෘතීම පරිපාලන රේඛා මඟින් වෙන් කරන ලදි.

මෙලෙස සිය පාරම්පරික වගාබිම් අහිමි වූ උඩරට ගැමි ජනතාව විවිධ ආර්ථික දුෂ්කරතාවනට මුහුණ දුන් අතර, ඒ හේතුවෙන් ආරථික, සමාජයීය හා දේශපාලනික වශයෙන් පසුබෑමකට ලක් විය. නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය ගරු ඩී.එස්. සේනානායක මැතිතුමා විසින් ඉංග්‍රීසි පාලන සමයෙහි ඓතිහාසික අසාධාරණකම් රැසකට මුහුණ දුන් උඩරට ගැමි ජනතාවගේ සමාජ, ආර්ථික සහ සංස්කෘතික තත්ත්වය පරීක්ෂා කර බලා වාර්තා කිරීම පිණිස 1949 ජනවාරි මස උඩරට ගැමි කොමිසම පත් කරන ලදි. එම කොමිසම 1953 ජනවාරි මාසයේදී අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලද නිර්දේශයන් පිළිගෙන උඩරට ජන සමූහය තුළින් දරිද්‍රතාවය තුරන් කිරීම හා ඔවුන් ආරථිකමය වශයෙන් සවිබල ගැන්වීම මෙන්ම සංස්කෘතික අනන්‍යතාවය සුරැකීම උදෙසා උඩරට ගැමි පුනරුත්ථාපනය පිළිබඳ වූ අති විශාල කර්තව්‍ය ආරම්භ කරන ලදි.

ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ උප දෙපාර්තමේන්තුවක් වශයෙන් ආරම්භ කරන ලද උඩරට ගැමි පුනරුත්ථාපනය සඳහා 1958 දී සම්බන්ධීකරණ නිලධාරියෙකු පත් කරන ලද අතර 1964 දී නැවතත් ඔහු උඩරට ගැමි පුනරුත්ථාපන කොමසාරිස්වරයා වශයෙන් නම් කරන ලදී පසුව 1968 දි මෙම උප දෙපාර්තමේන්තුව සී පන්තියේ දෙපාර්තමේන්තුවක්

වශයෙන් උසස් කරනු ලැබිණි. 1989 දී එවකට ජනාධිපති ප්‍රේමදාස මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් උඩරට ගැමි පුනරුත්ථාපන ව්‍යාපෘති අමාත්‍යාංශය යනුවෙන් වෙනම අමාත්‍යාංශයක් එවකට තිබූ ඉඩම්, වාරිමාර්ග සහ මහවැලි සංවර්ධන කැබිනට් අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලදි. මෙම දෙපාර්තමේන්තුව 1990 දී උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව වශයෙන් බී පන්තියට උසස් කිරීමත් සමග නව මගකට ප්‍රවිශ්ඨ වී ව්‍යාපෘති සැකසීමට සහ ඒවා ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී.

1951 වසරේදී උඩරට ගැමි පුනරුත්ථාපන කොමිසමට අනුව සිදුකලා වූ කටයුතු සොයාබැලීම සහ අදාල ප්‍රදේශවල සිදුවූ සංවර්ධන කටයුතු වැලැක්වීම පිළිබඳව අධ්‍යයනයක් කර වාර්තා කිරීම පිණිස 1994 දී ජනාධිපති කොමිසමක් පත් කරන ලදී. එම කොමිසම මගින් ප්‍රකාශයට පත්කරන ලද අධ්‍යයන වාර්තාව මගින් පෙන්වා දෙන ලද්දේ උඩරට ගැමි පුනරුත්තාපන දෙපාර්තමේන්තුව 1961 සිට 1994 දක්වා කාලය තුළ කරන ලද වැයකිරීම් වලින් විශාල ප්‍රමාණයක් ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කර ඇති බවත්, එමගින් එම ප්‍රදේශවල තිබූ සමහර යටිතල පහසුකම් ගැටළු විසඳීමට හේතු වුවත් ප්‍රධාන අරමුණ වන ගැමියන්ගේ ජීවන තත්වය නගා සිටුවීම තවමත් මිත්‍යාවක් ව ඇති බවයි.


1998 එ.ජා.සං. ජාතික මිනිස් සංවර්ධන වාර්තාව අනුව අන්ත දුගී බව උඩරටට අයත් දිස්ත්‍රික්කයන්හි 50% ඉක්මවා යාමක් දක්නට ලැබේ. එසේම 25% කට වැඩි දුක්ඛිත ''මානව දුගී බවක් '' ඇති දිස්ත්‍රික්කයන් ලෙසට උඩරට සියළුම දිස්ත්‍රික්ක දක්වා ඇත. අඩුම මානව සංවර්ධන දර්ශකය වන 0.649 වාර්තා වී ඇත්තේ ද මහනුවර දිස්ත්‍රික්කයෙනි (මධ්‍යම ලංකා සංවර්ධන සැලැස්ම 1994) එසේම මධ්‍යම ප්‍රදේශයේ දළ දේශීය නිෂ්පාදන ප්‍රතිශතය. මුළු රටේම සාමාන්‍යයට වඩා 33% කින් අඩුය (JAICA 1994). එම ප්‍රතිශතය අඩුම ප්‍රමාණය වාර්තා වනුයේ ද මොනරාගල සහ මහනුවර දිස්ත්‍රික්ක වලිනි.

ඉහත සංඛ්‍යාලේඛණ මගින් පැහැදිලිවන්නේ නිදහස් ශ්‍රී ලංකාවෙහි බලයට පත් සියළුම රජයන් පසුගිය දශක 05 ක කාලය තුළ උඩරට ප්‍රදේශයේ ක්‍රියාත්මක කළ සංවර්ධන වැඩසටහන් මගින් කන්ද උඩරට ගැමි ජනතාව පුනරුත්ථාපනය කර එම පළාත් අසරණ භාවයෙන්, දිළිදුභාවයෙන් හා පසුගාමී තත්වයෙන් මුදාගැනීමට දරනු ලැබූ උත්සාහයන් අසාර්ථක වී ඇති බවයි. එබැවින් උඩරට ප්‍රදේශයේ ග්‍රාමීය පෙදෙස් සංවර්ධනය කිරීම සඳහා නව ක්‍රමෝපායන් හා නව මගකින් යුත් ප්‍රවේශයක් අනුගමනය කළයුතු බවට වූ දැඩි අවශ්‍යතාවය මත ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය 2005 අංක 26 දරණ පණත මගින් ස්ථාපිත කරනු ලැබිණ. උඩරට ප්‍රදේශය තුළ සංවර්ධන ව්‍යාපෘති හඳුනාගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ඊට සම්බන්ධ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස 2005 අංක 26 දරන පාර්ලිමේන්තු පනතින් ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියට බලය පවරා ඇත.

ඒ අනුව ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ බල ප්‍රදේශය තුළ ආර්ථික සමාජීය සංස්කෘතික හා පාරිසරික සංවර්ධනය කඩිනම් කිරීම සඳහා 2006 අප්‍රේල් මස සිට මේ දක්වා ව්‍යාපෘති රාශියක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය හා අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක කරන ලදී. උඩරට ප්‍රදේශයේ ග්‍රාමීය ජනතාවගේ අසරණභාවය, දරිද්‍රතාවය සහ පසුගාමී මානසිකත්වය අවසන් කිරීම සඳහා ප්‍රධාන සංරචකයන් තුනක් ඔස්සේ යටිතල පහසුකම්, ජීවනෝපාය සංවර්ධනය හා ආධ්‍යාත්මික සංවර්ධන ව්‍යාපෘති අප අධිකාරිය මගින් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී.

# අධිකාරියේ ක්‍රියාත්මක බල ප්‍රදේශය

| අනු අංකය | පළාත | දිස්ත්‍රික්කය |
|---|---|---|
| 01 | මධ්‍යම | මහනුවර |
| | | මාතලේ |
| | | නුවරඑළිය |
| 02 | සබරගමුව | කෑගල්ල |
| | | රත්නපුර |
| 03 | ඌව | බදුල්ල |
| | | මොණරාගල |
| 04 | නැගෙනහිර | අම්පාර<br>මහඔය, පදියතලාව හා ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |



## ක්‍රියාත්මක බල ප්‍රදේශයේ මූලික දත්ත පිළිබඳ සාරාංශ සටහන


| අනු අංකය | පළාත | දිස්ත්‍රික්කය | ප්‍රා/ලේ කොට්ඨාශ සංඛ්‍යාව | ග්‍රා/නි වසම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | මධ්‍යම | මහනුවර | 20 | 1,188 |
| | | මාතලේ | 11 | 545 |
| | | නුවරඑළිය | 5 | 491 |
| 02 | සබරගමුව | කෑගල්ල | 11 | 573 |
| | | රත්නපුර | 17 | 575 |
| 03 | ඌව | බදුල්ල | 15 | 567 |
| | | මොණරාගල | 11 | 319 |
| 04 | නැගෙනහිර | අම්පාර | 20 | 503 |
| | **එකතුව** | | **110** | **4,761** |

(අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 20 න් ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ බල ප්‍රදේශයට අදාළ වන්නේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක් පමණි)

## නම්කරන ලද බල ප්‍රදේශය

සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළයුතු බල ප්‍රදේශය වශයෙන් මහනුවර දිස්ත්‍රික්කයේ පහත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 2009 වසරේ සිට නම් කර ඇත.

1. හතරලියද්ද
2. ගලගෙදර
3. හාරිස්පත්තුව
4. පූජාපිටිය
5. අකුරණ



## නම්කරන ලද බල ප්‍රදේශයෙහි මූලික දත්ත සටහන්

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | විශාලත්වය ව.කි.මී | වසම් ගණන | ගම්මාන සංඛ්‍යාව | මුළු ජනගහනය | පවුල් සංඛ්‍යාව | සමෘද්ධිලාභී පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| 1 | හතරලියද්ද | **62.00** | **57** | **112** | **31650** | **9802** | **3400** |
| 2 | ගලගෙදර | **54.00** | **67** | **141** | **39620** | **10548** | **3512** |
| 3 | හාරිස්පත්තුව | **59.00** | **84** | **148** | **92007** | **23501** | **8043** |
| 4 | පූජාපිටිය | **50.40** | **67** | **120** | **62477** | **15285** | **5275** |
| 5 | අකුරණ | **31.30** | **35** | **113** | **66759** | **13491** | **5221** |
| | **එකතුව** | **256.70** | **310** | **634** | **292513** | **72627** | **25451** |

## නම්කරන ලද බල ප්‍රදේශයේ අධ්‍යාත්මික සංවර්ධන දත්ත සටහන්

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | පාසල් | පන්සල් | | පල්ලි | | කෝවිල් සංඛ්‍යාව | කලායතන සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| | | පාසල් සංඛ්‍යාව | පන්සල් සංඛ්‍යාව | දහම් පාසල් සංඛ්‍යාව | මුස්ලිම් පල්ලි | ක්‍රිස්තියානි පල්ලි | | |
| 1 | හතරලියද්ද | 22 | 31 | 31 | 2 | - | 1 | 6 |
| 2 | ගලගෙදර | 20 | 36 | 28 | 3 | 2 | - | 5 |
| 3 | හාරිස්පත්තුව | 28 | 65 | 55 | 11 | - | - | 14 |
| 4 | පූජාපිටිය | 29 | 59 | 44 | 13 | 1 | 2 | 4 |
| 5 | අකුරණ | 26 | 16 | 17 | 57 | - | 6 | 1 |
| **එකතුව** | | **125** | **207** | **175** | **86** | **3** | **9** | **30** |

**අධිකාරියේ ප්‍රධාන සංවර්ධන සංරචකයන්**

**(1) ජීවනෝපාය සංවර්ධනය**

**(2) යටිතල පහසුකම් සංවර්ධනය**

**(3) ආධ්‍යාත්මික සංවර්ධනය**

# කළමනාකරණ මණ්ඩලය

## 01. හැඳින්වීම

අතිගරු ජනාධිපතිතුමා විසින් අට පුද්ගල සාමාජිකත්වයකින් යුතු කළමනාකරණ මණ්ඩයක් පත් කර ඇති අතර, අධිකාරියේ අරමුණු හා පරමාර්ථ ක්‍රියාවට නැංවීමට අවශ්‍ය බලතල, කාර්ය සහ කර්තව්‍ය එම මණ්ඩලය වෙත 2005 අංක 26 දරණ පණතින් පැවරී ඇත.

## 02. කළමණාකරණ මණ්ඩලයේ සංයුතිය (පනතේ පළමු වන පරිච්ඡේදයේ හතරවන වගන්තියේ සඳහන් වන පරිදි)

i. ''නිළ බලයෙන් පත් වන '' සාමාජික සංඛ්‍යාව - 03 (තිදෙනෙකු)
(උඩරට සංවර්ධන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා, මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගේ තත්වය දරන නිළධාරියෙකු, වතු යටිතල පහසුකම් විෂයභාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නිළධාරියෙකු)

ii. ''පත් කළ සාමාජිකයින් '' - 05 (පස්දෙනෙකු)
(විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශ මත ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන)

## *03. කළමණාකරණ මණ්ඩලයේ සාමාජිකත්වය 2012 වර්ෂය*

| අනු අංකය | සාමාජිකයාගේ නම | සාමාජිකත්වයේ ස්වභාවය | | පත් කළ දිනය | ඉවත් වූ දිනය |
|---|---|---|---|---|---|
| 01 | අමරනන්ද වීරසිංහ මහතා | පත් කළ සාමාජික | සභාපති/ කළමනාකරණ මණ්ඩල සාමාජික | 2008.12.31 | - |
| 02 | එස්.ආර්. කරුණාරත්න මහතා | පත් කළ සාමාජික | කළමනාකරණ මණ්ඩල සාමාජික | 2010.08.19 | - |
| 03 | අසංක බණ්ඩාර දොඩංවල මහතා | පත් කළ සාමාජික | කළමනාකරණ මණ්ඩල සාමාජික | 2010.08.19 | 2012.01.09 |
| 04 | අබ්දුල් වාහිඩ් මොහොමඩ් මහතා | පත් කළ සාමාජික | කළමනාකරණ මණ්ඩල සාමාජික | 2010.08.19 | - |
| 05 | වෝල්ටර් රණසිංහ මහතා | පත් කළ සාමාජික | කළමනාකරණ මණ්ඩල සාමාජික | 2010.08.19 | - |
| 06 | කේ.ජී.කේ. විමලවීර මහත්මිය | නිළ බලයෙන් පත්වන | කළමනාකරණ මණ්ඩල සාමාජික | 2010.09.15 | - |
| 07 | එච්.එම්.ගාමිණී සෙනවිරත්න මහතා | පත් කළ සාමාජික | කළමනාකරණ මණ්ඩල සාමාජික | 2012.07.16 | - |
| 08 | එස්. සනත් සේනාධීර මහතා | පත් කළ සාමාජික | කළමනාකරණ මණ්ඩල සාමාජික | 2012.07.16 | - |

## 04. කළමනාකරණ මණ්ඩලය වෙත පැවරී ඇති බලතල

ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ පරමාර්ථ හා අරමුණු ක්‍රියාවට නැංවීමට අවශ්‍ය සියළු තීරණ ගැනීම්, කළමනාකරණය කිරීම ආදි සියළු කටයුතු සඳහා 2005 අංක 26 දරණ ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරි පනතේ පළවෙනි ඡේදය හා දෙවන ඡේදය යටතේ පුළුල් බලතල කළමනාකරණ මණ්ඩලය වෙත ලබා දී ඇත. එකී බලතල වලට අනුව උඩරට ප්‍රදේශය තුල නිෂ්පාදනශීලීත්වය නන්වාලීම. ආදායම් හා රැකියා උත්පාදනය සඳහා මෙන්ම පොදුවේ ආර්ථික, සමාජයීය, සංස්කෘතික සා පාරිසරික සංවර්ධනය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය වූ ව්‍යාපෘති හඳුනා ගැනීම්, සැලසුම් කිරීම්, ක්‍රියාත්මක කිරීම් හා සම්බන්ධීකරණය කිරීම් පිළිබඳව කළමනාකරණ මණ්ඩලයට පූර්ණ වූ බලතල අනුව කළමනාකරණ මණ්ඩලය සතුව ඇත.

අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන සාමාජිකයින්ගෙන් කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය සැදී ඇත. සාමාජිකයින් සංඛ්‍යාව 08 දෙනෙකු වේ. පනතේ පළමු වන පරිච්ඡේදයේ සඳහන් වන පරිදි නිල බලයෙන් සාමාජිකයින් 03 දෙනෙකුද පත් කල සාමාජිකයින් 05 දෙනෙකුද කළමනාකරණ මණ්ඩලයේ සංයුතියට අදාල වේ. ඒ අනුව නිල බලයෙන් පත් වන සාමාජිකයින් තුල විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා, මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් තත්වය දරණ නිළධාරියෙකු හා විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා නම් කරන නිලධාරියෙකු අයත් වන අතර, පත් කල සාමාජිකයින් 05 දෙනා තුල විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන සාමාජිකයින් අයත් වේ.

## 05. කළමනාකරණ මණ්ඩලය විසින් 2012 වර්ෂය තුළදී ගෙන ඇති තීරණ පිළිබඳ සංක්ෂිප්ත සටහනක්

2012 වර්ෂය තුළදී කළමනාකරණ මණ්ඩල රැස්වීම් 10 ක් පවත්වා ඇත. මෙම රැස්වීම් වලදී විශේෂ අවධානයක් අධිකාරියේ මූල්‍ය හා පරිපාලන කටයුතු විධිමත් කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන අනුමත කිරීමට මෙන්ම අධිකාරියට අත්‍යාවශ්‍ය මානව හා භෞතික සම්පත් සපුරා ගැනීම සඳහා අවශ්‍ය තීරණ ලබාගෙන ඇත.

- **මුදල් රෙගුලාසි වලට අනුව වියදම් කිරීම හා බලය බෙදීම අනුමත කිරීම**
- **2012 වර්ෂයේ සංක්ෂිප්ත දළ සංවර්ධන සැලැස්ම අනුමත කර ගැනිම**
- **2012 වර්ෂයේ මාසිකව ඉදිරිපත් කරන පුනරාවර්තන හා ප්‍රාග්ධන හා විවිධ ආදායම් වාර්ථා අනුමත කර ගැනිම**

- 2012 වර්ෂයේ පේරාදෙණිය පැළ අලෙවි සැලේ මාසික වෙළඳ හා ලාභාලාභ ගිණුම් ඉදිරිපත් කිරීම්
- චක්‍රීය අරමුදල් අය කරගැනිම
- නොනිමි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- පශු සම්පත් සංවර්ධන වැඩසටහන - 2012
- සංවරධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- 2012 වර්ෂය සඳහා ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයිම් කමිටුව පත්කිරිම
- අවිච්ඡේද හා බැඳිම්ගත ව්‍යාපෘති අවසන් කිරීම
- කලමණාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත වී පුරප්පාඩුව පැවති නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන හා මුදල්) , නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්), ලිපිකරු, කා.කා.ස. හා රියදුරු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරීම
- 2012 වර්ෂය සඳහා ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණ ඇගයිම් කමිටුව පත්කිරිම

# අරමුණු හා පරමාර්ථ

**(2005 අංක 26 දරණ ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරි පනත යටතේ 11 පරිච්ඡේදයට අනුව)**

**(අ)** බල ප්‍රදේශය තුළ නිෂ්පාදනශීලිත්වය නංවාලීමට ආර්ථික, සමාජීය, සංස්කෘතික සහ පාරිසරික සංවර්ධනය වැඩි දියුණු කිරීමට හා ආදායම් ඉහළ නැංවීමට මෙන්ම රැකියා අවස්ථා උත්පාදනය කිරීමට යම් නම් කළ ප්‍රදේශයක් තුළ සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

**(ආ)** නම් කළ බල ප්‍රදේශය සඳහා වූ සමස්ත සංවර්ධන සැලසුමෙහි දී හඳුනාගෙන ඇති ව්‍යාපෘති පිළිබඳව විස්තරාත්මකව අධ්‍යයනය කිරීම.


**(ඇ)** ඓතිහාසික, සාමාජීය සහ වෙනත් හේතු නිසා කොන් වී සිටින ජන කොටස් හඳුනා ගැනීම සහ ඔවුන්ගේ සාමාජීය සහ ආර්ථික තත්ත්වය නැංවීමට යෝජනා සකස් කිරීම. අරමුදල් රැස් කිරීම සහ ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.

**(ඈ)** මහනුවර නගරයේ ඓතිහාසික වැදගත්කම සහ ජාතික වශයෙන් එහි ඇති සංස්කෘතික හා ආර්ථික වැදගත්කම සැලකිල්ලට ගනිමින්, මහනුවර නගරය සහ එහි උරුමය ද. සංස්කෘතික ආයතන ද, පරිසරය සහ යටිතල පහසුකම් ද සංරක්ෂණය කිරීම කෙරෙහි විශේෂ අවධානය ව්‍යාප්ත කිරීම.

**(ඉ)** යම් නම් කළ ප්‍රදේශයක් තුළ (ආ) ඡේදයේ සඳහන් කර ඇති අධ්‍යයන කිරීමේ දී සහ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී, රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය ආයතන, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, පළාත් සභා බලධරයන්ගෙන් සහ ස්වාභාවික හා නෛතික වුව ද, පෞද්ගලික හා රාජ්‍ය වුව ද වෙනත් පුද්ගලයන්ගෙන් ද සහයෝගීත්වය ලබා ගැනීම.

**(ඊ)** යම් නම් කළ ප්‍රදෙශයක් තුළ (ආ) ඡේදයේ සඳහන් කර ඇති, විස්තරාත්මකව අධ්‍යයනය කිරීමේ දී සහ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී දේශීය, විදේශීය හා පුද්ගලික අංශ නියෝජ්‍යාතනවල සහභාගීත්වය ලබා ගැනීම.

## අරමුණු හා පරමාර්ථ ඉෂ්ඨකරගැනීම සඳහා වූ සංවිධාන ව්‍යුහය.



## කාර්ය මණ්ඩල විස්තරය.

ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ පරමාර්ථ හා කාර්යභාරය ඉටුකිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2006 වර්ෂයේ දී අනුමත කර ඇති කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් සංඛ්‍යාව 33 කි. 2007 වර්ෂයේ දී ආයතනයට අවශ්‍ය කාර්ය මණ්ඩල සාමාජිකයින් 17 දෙනෙකු සඳහා නැවත අනුමැතියක් ලබා දී ඇත.
ඒ අනුව ආයතනයේ සමස්ථ කාර්ය මණ්ඩලය 50 ක් ලෙස සඳහන් වුවත් 2012 වර්ෂයේ දී මෙම අධිකාරියේ කාර්ය මණ්ඩල සංයුතිය පහත පරිදි වේ.

## ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය

## ආයතනික කාර්‍ය මණ්ඩලය - 2012

| අනු අංකය | තනතුර | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති ස්ථිර කාර්‍ය මණ්ඩලය | දැනට සේවයේ නිරත ස්ථිර කාර්ය මණ්ඩලය | වෙනත් |
|---|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 2012/04/23 දින සේවයෙන් ඉල්ලා අස්වී ඇත. |
| 2 | අධ්‍යක්ෂ (සංවර්ධන) | 1 | 1 | 2012/04/23 දින සේවය අවසන් කර ඇත. |
| 3 | නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) | 1 | 1 | - |
| 4 | නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන හා මුදල්) | 1 | 1 | - |
| 5 | ගණකාධිකාරි | 1 | 0 | වැඩතහනමට ලක් වී ඇත. |
| 6 | සිවිල් ඉංජිනේරු | 1 | 0 | - |
| 7 | සහකාර අධ්‍යක්ෂ (පශු සම්පත්) | 1 | 1 | - |
| 8 | සහකාර අධ්‍යක්ෂ (සැලසම්) | 2 | 1 | - |
| 9 | සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) | 2 | 0 | - |
| 10 | පරිපාලන නිළධාරි | 1 | 0 | - |

| අනු අංකය | තනතුර | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති කාර්‍ය මණ්ඩලය | දැනට සේවයේ නිරත කාර්ය මණ්ඩලය | වෙනත් |
|---|---|---|---|---|
| 11 | සංවර්ධන සහකාර | 3 | 2 | - |
| 12 | ගිණුම් සහකාර | 1 | 1 | - |
| 13 | කාර්මික නිළධාරි (1 ශ්‍රේණිය) | 1 | 0 | - |
| 14 | කාර්මික නිළධාරි | 4 | 3 | - |
| 15 | ලිපිකරු | 13 | 12 | එක් නිළධාරියෙකු වැඩ තහනමට ලක්වී ඇත. |
| 16 | රියදුරු | 8 | 8 | - |
| 17 | කා.කා.ස. | 5 | 5 | - |
| 18 | කම්කරු | 3 | 3 | - |
| **එකතුව** | | **50** | **40** | |

2012 වසරේ ආයතනය මඟින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් ක්‍රියාවට නැංවීම සඳහා ස්ථිර කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවූ බැවින් කොන්ත්‍රාත් පදනම මත, දෛනික පදනම මත හා සේවා මිලදී ගැනීම් පදනම මත සේවකයින් බඳවා ගැනීමට සිදු විය.

ඒ අනුව 2012 වසරේ දී ආයතනයේ සේවයේ නිරත වූ ස්ථිර නොවන කාර්ය මණ්ඩලය පහත දැක්වෙන පරිදි වේ.

| අනු අංකය | සේවය කරනු ලබන පදනම | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | කොන්ත්‍රාත් පදනම මත | 04 |
| 02 | දෛනික පදනම මත | 01 |
| 03 | සේවා මිළදීගැනීම | 02 |
| **එකතුව** | | **07** |

# පාලන අංශය

2005 අංක 26 දරණ පනතින් පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ පාලන අංශයෙන් ආයතනයේ සියලුම මානව හා භෞතික සම්පත් නිසි ලෙස කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය දායකත්වය ලබාදීම ප්‍රමුඛ වගකීමක් වන අතර 2012 වසරේදී ද සිදු කරන ලදි.

ඒ අනුව ආයතනය මඟින් ඉටු කරනු ලබන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා කාර්යය මණ්ඩල සාමාජිකයින්ගේ ප්‍රවීනත්වය හා කුසලතාවය වැඩිදියුණු කිරීම අවශ්‍ය මාර්ගෝපදේශයන් ද පාලන අංශය මගින් ලබාදෙන ලදි.

කෙසේ වෙතත් ආයතනයේ භෞතික සම්පත් කළමනාකරණය කිරීමේ දී 2011 වර්ෂය අවසාන කාර්තුව වන විට අධිකාරිය වෙත ලැබුණු කැබ් රථ හා මෝටර් රථ සමඟ 2012 වර්ෂය ආරම්භ වන විට මෙම අධිකාරියේ වාහන සංචිතය 12 ක්ව පැවතින. මෙම වාහන අතුරින් වාහන 07 ක් ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය සතුය. එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම වැඩසටහනට අයත්ව තිබූ 32-5451 ජීප් රථය 2012 වර්ෂය අවසාන වන විට මෙම අධිකාරියට පවරා ගත් අතර ඒ අනුව වාහන සංචිතයෙන් වාහන 08 ක අයිතිය අප අධිකාරිය සතු කර ගැනීමට හැකි විය.

ජාතික සවිය ගම නැගුම වැඩසටහන යටතේ අවශ්‍ය පසුවිපරම් කටයුතු කිරීමට වෙන් වූ බල ප්‍රදේශයන් හි ග්‍රාම නිළධාරි වසම් 310 ක සංවර්ධන කටයුතු පසු විපරම් කිරීම හා අදාල කාර්යයන් සඳහා හා නොනිම් ව්‍යාපෘති අවසන් කිරීම සඳහා අවශ්‍ය පසුවිපරම් කටයුතු සඳහා නිළධාරින් වෙත අවශ්‍ය ප්‍රවාහන පහසුකම් ලබාදීමට ද පාලන අංශය ප්‍රමුඛ කාර්යක් විය.

ආයතනයේ අවශ්‍යතා අනුව 2012 වර්ෂයට අවශ්‍ය සමස්ථ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම හා ඒ සඳහා අවශ්‍ය සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ කර්තව්‍යයද පාලන අංශය විසින් සිදු කරන ලදි.

ආයතනයේ සංවර්ධන අංශය, ඉංජිනේරු අංශයට අදාල සියලු යටිතල පහසුකම්, ජීවනෝපාය සංවර්ධන කටයුතු හා අයදත්මික සංවර්ධන කිරීම සඳහා අවශ්‍ය සියලුම සම්පත් නිසි ආකාරව ලබාදීමටද කටයුතු කර ඇත.

2012 වර්ෂය තුළ අධිකාරියට අත්‍යාවශ්‍ය වු සමස්ත ලිපිගොනු නමාවලියක් සකස් කර ගැනිමට ද අපට හැකියාවක් ලැබුණි.

2012 වර්ෂයේ නිලධාරින් සඳහා විධිමත් පුහුණු සැලැස්මක් සකස් කර ද මෙම අධිකාරිය දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය වීම හේතු කොට ගෙන ආයතනය තුළ නිලධාරින්ගේ පුහුණු කටයුතු තාවකාලිකව අත්හිටුවීමට සිදු විය. ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ විශේෂ ප්‍රධානම කාර්ය වන කළමණාකරණ මණ්ඩල රැස්වීම් පැවැත්වීමට හා සංවිධානය කිරිමට කලමණාකරන මණ්ඩල ලේකම් විසින් අවශ්‍ය කටයුතු සිදුකරන ලදි. .

ඒ අනුව 2012 වර්ෂයේ දි කළමනාකරණ මණ්ඩල රැස්වීම් 10 ක් පවත්වා අධිකාරියේ මූල්‍ය හා පරිපාලන කටයුතු විධිමත් කිරිම සහ අවශ්‍ය අනුමැතිය ලබා ගනිමින් ඒ තුලින් අත්‍යාවශ්‍ය වූ මානව භෞතික සම්පත් සපුරා ගැනීමට අවශ්‍ය තීරණයන් ද කළමණාකරණ මණ්ඩලය විසින් ලබා ගන්නා ලදි.

ඒ අනුව ආයතනයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම මුදල් රෙගුලාසි වලට අනුව බලය විමධ්‍යගත කිරිම. 2012 වර්ෂයේ දළ සංවර්ධන සැලැස්ම අනුමත කරගැනීම. පුනරාවර්තන ප්‍රාග්ධන හා විවිධ ආදායම් වාර්තා අනුමත කර ගැනීමට කටයුතු කර ගැනීම නොනිම් ව්‍යාපෘති වල ප්‍රගතිය පසුවිපරම් කිරිම පශු සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම. අවිච්ඡේද හා බැදිම්ගත ව්‍යාපෘති අවසන් කිරිම හා කලමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ බඳවාගැනීමේ පටිපාටියට අනුව පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා නිළධාරින් බඳවා ගැනීමට කළමනාකරණ මණ්ඩලයේ විශේෂ අවධානය යොමු කර තීරණයන් ලබා දී ඇත.

මීට අමතරව ආයතනය වෙත පැවරී ඇති නඩු විධිමත්ව පවත්වාගෙන යාමටත් ඒ අනුව අවශ්‍ය ලේඛන සකස් කිරීමත් කළමානකරණ මණ්ඩලය විසින් අනුමත කල නිතිඥ මණ්ඩලයක් මගින් අදාල නඩු සඳහා ආයතනය වෙනුවෙන් පෙනි සිටීමටත් පාලන අංශය වෙත පැවරී ඇත.

මේ අනුව ආයතනයේ සමස්ථ පරිපාලනයට අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලබා දි කළමනාකරණ මණ්ඩලයේ තිරණයන් අනුව ආයතනයේ ක්‍රියාදාමයන් සඳහා 2012 වර්ෂයේ පාලන අංශය මගින් අධිකාරියේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනිමට සෘජු දායකත්වයක් ලබාදි එම කාර්යන් සාර්ථකව ක්‍රියාත්මක කරවීමට ප්‍රමුඛත්වය දි කටයුතු කිරිමට හැකි විය.

# මූල්‍ය හා කළමනාකරණ

**2012 වර්ෂය සදහා ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ ශේෂ පත්‍රය හා ආදායම් වියදම් ප්‍රකාශය පහත පරිදි වේ**

**2012 දෙසැම්බර් 31 දිනට**
**ශේෂ පත්‍රය**

| | 2012 | 2011 |
|---|---|---|
| | රු.ශත | රු.ශත |
| **වත්කම්** | | |
| දේපළ.පිරියත හා උපකරණ | 26,091,594.53 | 28,566,391.59 |
| **ජංගම වත්කම්** | | |
| තොගය | 240,415.88 | 411,838.45 |
| ස්ථාවර තැන්පතු | 8,177,224.21 | 5,863,157.13 |
| විවිධ ණය ගැතියෝ | 826,178.74 | 203,550.00 |
| ලැබිය යුතු චක්‍රීය අරමුදල් | 8,374,868.60 | 6,151,455.01 |
| අත්තිකාරම්-කොන්ත්‍රාත් | 1,444,210.42 | |
| ලැබිය යුතු පොලී ගිණුම | 41,263.78 | |
| උත්සව අත්තිකාරම් ගිණුම | 32,000.00 | 55,000.00 |
| මුදල් ශේෂය - i | 7,271,813.86 | 53,513,849.01 |
| මුදල් ශේෂය - ii | 472,340.31 | 953,829.51 |
| ඉතිරි කිරීමේ ගිණුම | 1,601,728.93 | |
| මාර්ගස්ථ මුදල් ගිණුම | 500,000.00 | |
| **මුළු වත්කම්** | **55,073,639.26** | **146,834,761.07** |
| **ජංගම වගකීම්** | | |
| රදවාගැනීම් | 1,513,898.74 | 1,082,489.78 |
| පාරිතෝෂික වෙන්කිරීම් | 2,432,882.15 | 895,152.50 |
| උපචිත වියදම් | 65,489.26 | 636,650.85 |
| විවිධ ණය හිමියෝ | | |
| රදවා ගැනීම් බදු | 5,750.00 | 4,400.00 |
| ගෙවිය යුතු අවිච්ජේද | 1,228,780.31 | 50,127,342.70 |
| ගෙවිය යුතු තැන්පතු | 1,540,000.00 | 1,565,000.00 |
| සේවක ඇප තැන්පතු | - | 60,500.00 |
| විගණන ගාස්තු වෙන් කිරීම | 800,000.00 | |
| ගෙවිය යුතු චක්‍රීය අරමුදල් | 19,903.50 | |
| **මුළු වගකීම්** | **7,606,703.96** | **54,371,535.83** |
| ශුද්ධ වත්කම් | **47,466,935.30** | **92,463225.24** |
| **හිමිකම් හා වගකීම්** | | |
| රාජ්‍ය ප්‍රතිපාදන ගිණුම | 26,306,684.12 | 28,944,324.92 |
| අතිරික්තය / ඌණතාවය | 21,160,251.18 | 63,518,900.32 |
| | **47,466,935.30** | **92,463,225.24** |

**<u>ආදායම් වියදම් ප්‍රකාශය</u>**

| | 2012<br>රු.ශත | 2011<br>රු.ශත |
|---|---|---|
| **අරමුදල් ලැබීම්** | | |
| භාණ්ඩාගාරය - ප්‍රාග්ධන ලැබීම් | - | 213,787,035.00 |
| - පුනරාවර්ථන ලැබීම් | 20,640,000.00 | 22,908,190.00 |
| විවිධ ආදායම් | 2,263,667.64 | 1,338,661.85 |
| රාජ්‍ය ප්‍රතිපාදන ගිණුම | 2,624,306.45 | 3,076,506.17 |
| චක්‍රිය අරමුදල | - | 1,009,470.00 |
| **මුළු ලැබීම්** | **25,527,974.09** | **242,119,863.02** |
| **මෙහෙයුම් වියදම්** | | |
| පුද්ගල පඩිනඩි | 16,628,868.94 | 15,491,867.68 |
| ගමන් වියදම් | 268,466.25 | 385,272.59 |
| සැපයීම් හා වෙනත් | 1,673,141.86 | 1,591,099.62 |
| නඩත්තු වියදම් | 1,651,980.99 | 3,612,108.77 |
| ගිවිසුම්ගත සේවා | 1,162,622.18 | 1,331,050.98 |
| ක්ෂය | 2,624,306.45 | 3,076,506.17 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 5,926,224.80 | 3,072,808.46 |
| සංවර්ධන වියදම් | 34,362,613.65 | 207,879,862.15 |
| **මුළු මෙහෙයුම් වියදම්** | **64,298,225.12** | **236,440,576.42** |
| අතිරික්තය/ ඌණතාවය- මෙහෙයුම් | (-38,770,251.03) | 5,679,286.60 |
| ඉ/ගෙ ශේෂය | 59,930,502.21 | 57,839,613.72 |
| මුළු අතිරික්තය/ ඌණතාවය | **21,160,251.18** | **63,518,900.32** |

2012 වර්ෂයේ මුල්‍ය කළමණාකරන අංශයේ ශේෂ පත්‍රය පිරික්සීමේදී දේපල, පිරියත, හා උපකරණවල අගය අඩුවීමක් සිදු වී ඇත. 2012 වර්ෂයේ භාණ්ඩ වෙන්දේසියෙන් රු. 118,703.00 ක වත්කම් විකිණීමත්, 2012 වර්ෂයේ ක්ෂය රු.මි. 2,616 ක් වීමත් මෙයට හේතු වී ඇත. 2012 වර්ෂයේ කිසිදු ස්ථාවර වත්කමක් මිලදී ගැනීමක් සිදු වී නැත.

ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ චක්‍රීය අරමුදල මගින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර තැන්පතුව රු.මි. 5.83 ක් 2011 වර්ෂය අවසන් වන විට පැවති අතර, එය 2012-12-31 දින වන විට රු.මි. 5.42 කි. 2012 වර්ෂය තුලදී මෙම ස්ථාවර තැන්පතුවට අළුතින් රු.මි. 2.563 ක මුදලක් බැර වුවත්, 2012 වර්ෂයේ පුනරාවර්තන ප්‍රතිපාදන වල හිගය පියවීම පිණිස රු.මි. 3 ක මුදලක් බැර වුවත්, 2012 වර්ෂයේ පුනරාවර්ථන

ප්‍රතිපාදන වල හිගය පියවීම පිණිස රු.මි. 3 ක මුදලක් කළමණාකරණ මණ්ඩලයේ අනුමැතිය මත මෙම ස්ථාවර තැන්පතුවෙන් ලබා ගැනීමට සිදුවිය.

එසේම පාරිතෝෂික මුදල් වෙන් කිරිම වෙනුවෙන් හා කඩුගන්නාව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර හිමියන්ගේ තැන්පතු මුදල් වෙනුවෙන් නව ස්ථාවර තැන්පතු 2 ක් ආරම්භ කළ අතර ඒ අනුව 2012-12-31 දින වන විට මුළු ස්ථාවර තැන්පතුවල වටිනාකම රු.මි. 8,177 කි.

**<u>ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය සතු ස්ථාවර තැන්පතු පහත පරිදි වේ.</u>**

චක්‍රිය අරමුදලින් ආරම්භ කළ ස්ථාවර තැන්පතුව - රු.මි. 5,426
කඩුගන්නාව වෙළඳ සංකීර්ණයේ තැන්පතු මුදලින් ආරම්භ කළ ස්ථාවර තැන්පතුව - රු.මි. 1.649
පාරිතෝෂික දීමනා සඳහා ආරම්භ කළ ස්ථාවර තැන්පතුව -රු.මි. 1.101


## <u>පුනරාවර්ථන වියදම්</u>

2011 වර්ෂය හා සසඳා බැලීමේදී පුනරාවර්ථන වියදම්වල රු.මි. 1.827 ක වැඩි වීමක් දක්නට ඇති අතර එය පහත පරිදි විග්‍රහ කර දැක්විය හැක.

## <u>පුනරාවර්තන වියදම් -2012 හා 2011</u>

| අනු අංකය | විස්තරය | 2012 | % | 2011 | % |
|---|---|---|---|---|---|
| 1 | පුද්ගලික පඩිනඩි | 16,628,868.94 | 60.89 | 15,491,867.68 | 60.79 |
| 2 | ගමන් වියදම් | 268,466.25 | 0.98 | 385,272.59 | 1.51 |
| 3 | සැපයීම් හා සේවා | 1,673,141.86 | 6.13 | 1,591,099.62 | 6.24 |
| 4 | නඩත්තු | 1,651,980.99 | 6.05 | 3,612,108.77 | 14.17 |
| 5 | ගිවිසුම් ගත සේවා | 1,162,622.18 | 4.26 | 1,331,050.98 | 5.22 |
| 6 | වෙනත් මෙහෙයුම් වියදම් | 5,926,224.80 | 21.70 | 3,072,808.46 | 12.06 |
| | **එකතුව** | **27,311,305.02** | **100.00** | **25,484,208.10** | **100.00** |

## පුනරාවර්තන වියදම් - 2012




පුද්ගලික පඩිනඩි පිළිබඳව සලකා බැලීමේදී 2011 වසරට සාපේක්ෂව රු.මි. 1.137 ක වැඩිවීමක් දක්නට ඇත. පාරිතෝෂික දීමනා සඳහා රු.මි. 1.537 ක මුදලක් වෙන් කිරීමක් ලෙස සටහන් කිරීම මෙම වැඩි වීමට මුලික හේතුව වී ඇත. 2012 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ගමන් වියදම්වල අඩුවීමක් දක්නට ඇත. එසේම භාණ්ඩ හා සේවා මිළ ගණන් ඉහල යාම හේතුවෙන් සැපයීම් හා සේවා වියදම් 2011 වසරට සාපේක්ෂව රු. 8242.00 කින් ඉහල ගොස් ඇත. වෙනත් මෙහෙයුම් වියදම් වල රු.මි. 2,853 ක වැඩි වීමක් දක්නට ඇත. සේවක අර්ථ සාධක අරමුදලේ රු.මි. 2.5 ක හිග මුදලක් ගෙවීම මෙයට හේතු වී ඇත.

එසේම පුනරාවර්ථන වියදම් සඳහා 2011 වර්ෂයේ රු.මි. 22.9 ක මුදලක් අක්මුදල් ලෙස ලැබුණු අතර, 2012 වර්ෂයේ පුනරාවරථන අක්මුදල් ලෙස ලැබී ඇත්තේ රු.මි. 20.64 කි. එය 2011 වසරට සාපේක්ෂව රු.මි. 2.268 ක අඩුවීමකි. ප්‍රතිශතයක් ලෙස 9.9% කි.

ප්‍රාග්ධන වියදම් පිළිබඳ සලකා බැලීමේ දී 2012 වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන ලෙස රු.මි. 50 ක් අනුමත වී තිබුණද 2012 වර්ෂය සඳහා ප්‍රාග්ධන අක්මුදල් ලෙස කිසිදු මුදලක් අප අධිකාරිය වෙත නොලැබුණි.

2012-12-31 දිනට ආදායම් වියදම් ප්‍රකාශයේ සංවර්ධන වියදම් ලෙස සටහන්ව ඇත්තේ 2011 වර්ෂයේ ව්‍යාපෘති සඳහා ගෙවන ලද මුදල් හා පරිපාලන වියදම්ය. 2012 වර්ෂය සඳහා නව ව්‍යාපෘති ක්‍රියාත්මක වීමක් සිදු කර නැත.

එසේම 2012 වර්ෂයේ නොනිමි හා විශේෂ ව්‍යාපෘති සඳහා අධිකාරියේ 2011-12-31 දිනට පැවති ආරම්භක මුදල් ශේෂයෙන් ගෙවීම් සිදුකල අතර, 2012 වර්ෂයේ වියදම් දරන ලද නොනිමි ව්‍යාපෘති හා විශේෂ ව්‍යාපෘති පහත පරිදි වේ.

## නොනිමි ව්‍යාපෘති

| අනු අංකය | ව්‍යාපෘතිය | මුදල (රු.ශත) |
|---|---|---|
| 1 | වීවල පාලම ඉදි කිරීම | 4,399,124.35 |
| 2 | උඩුව ආදාහනාගාරය ඉදිකිරීම | 60,000.00 |
| 3 | උඩවැලිකැටිය අමුණේවෙල පාලම ඉදිකිරීම | 9,472.23 |
| 4 | බෝගහකුඹුර තැන්නේකුඹුර පාලම ඉදි කිරීම | 2,063,787.30 |
| 5 | අකුරණ සිත්තෝඩය  පාලම ඉදිකිරීම | 9,472.23 |
| 6 | හියරාපිටිය හොරේකොටේ නාගහමුල පාලම ඉදි කිරීම | 1,014,860.04 |
| 7 | නව තිස්පනේ බහුකාර්ය ගොඩනැගිල්ල ඉදි කිරීම | 792,396.01 |
| 8 | මල්ලන්ද බහුකාර්ය ගොඩනැගිල්ල ඉදි කිරීම | 845,086.42 |
| 9 | වීවල පාලම දෙපස පිවිසුම් මාර්ගය ඉදි කිරීම | 195,174.65 |
| 10 | මාවෙල ප්‍රජාශාලාව ඉදි කිරීම | 423,746.59 |
| 11 | උඩවැලිකැටිය අමුණේවෙල පාලම  ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම | 9,472.23 |
| **එකතුව** | | **9,822,592.05** |

## විශේෂ ව්‍යාපෘති

| අනු අංකය | ව්‍යාපෘතිය | මුදල (රු.ශත) |
|---|---|---|
| 1 | ගලගෙදර වැසිකිළි පද්ධතිය ඉදිකරීම | 1,298,879.34 |
| 2 | කඩුගන්නාව වැසිකිළි පද්ධතිය ඉදිකිරීම | 666,128.78 |
| **එකතුව** | | **1,965,008.12** |

2012 වර්ෂයේ ආදායම් පිළිබඳ සලකා බැලීමේ දී 2012 වර්ෂය සඳහා වන ආදායම රු.මි.1.411 කි. එයහ 2011 වසරට සාපේක්ෂව රු.මි.0.437 ක වැඩි වීමකි. ප්‍රතිශතයක් ලෙස 44.82% ක වැඩි වීමකි. කඩ කාමර කුලී හා ආදායම් උපචිත පදනම මත ගණනය කර ඇත.

## විවිධ ආදායම් - 2012

| අනු අංකය | ව්‍යාපෘතිය (ආදායම්) | 2012 | 2011 |
|---|---|---|---|
| 1 | කඩ කාමර කුලී-කඩුගන්නාව වෙළඳ සංකීර්ණය | 573,600.00 | 528,200.00 |
| 2 | කඩ කාමර කුලී-බෙරගල ආර්ථික මධ්‍යස්ථානය | 64,800.00 | 64,800.00 |
| 3 | කුලී ආදායම-අකුරණ කිරිහල | 8,800.00 | 44,400.00 |
| 4 | කුලී ආදායම-හතරලියද්ද කිරිහල | 19,000.00 | 16,700.00 |
| 5 | කුලී ආදායම-බෙලිහුල්ඔය ගිමන්හල | 19,100.00 | 17,532.12 |
| 6 | දිවිනැගුම පැල අලෙවි සැලෙහි ආදායම | 135,615.38 | 77,695.00 |
| 7 | සැපයුම්කරුවන් ලියාපදිංචිය | 98,125.00 | 120,500.00 |
| 8 | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු | 18,500.00 | - |
| 9 | භාණ්ඩ වෙන්දේසියෙන් ලද ආදායම | 77,153.27 | 63,265.20 |
| 10 | පත්තර විකුණුම් ආදායම | 6,497.00 | 2,347.00 |
| 11 | රඳවාගැනීම් ආදායමට ගැනීම් (කොන්ත්‍රාත්) | - | 34,303.60 |
| 12 | දඩ මුදල් | 387,211.04 | - |
| 13 | වෙනත් ආදායම් | 2,808.00 | 4,727.00 |
| **එකතුව** | | **1,411,209.69** | **974,469.92** |

## 2012 වර්ෂයේ ගිණුම් අංශය මගින් ඉටු කරන ලද කාර්යන්

- මු.රේ 66 ට අනුව වැය විෂයන් සංයෝජනය කිරීම පිණිස මණ්ඩල පත්‍රිකාවක් සකස් කොට අනුමත කරවා ගැනීම.

- විගණන කමිටු රැස්වීම් 03 ක් පැවැත්වීම.

- ආදායම් හා වියදම් සඳහා සංකේත අංක භාවිතා කිරීම පිණිස මණ්ඩල පත්‍රිකාවක් සකස් කොට අනුමත කරවා ගැනීම.

- පාරිතෝෂික දීමනා ගෙවීම සඳහා අරමුදලක් පිහිටුවීම හා එමගින් ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීමට කටයුතු කිරීම.

- කඩුගන්නාව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර බදු හිමියන්ගේ තැන්පතු මුදල් මගින් ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම.

- ගිණුම් අංශයේ හා සංවර්ධන අංශයේ චක්‍රිය අරමුදල් වල ශේෂයන්හි වෙනස්කම් පැවතීම හේතුවෙන් සංවර්ධන අංශයේ නිලධාරින් ද සහභාගි කරවාගෙන චක්‍රිය අරමුදල් ශේෂයන් තුලනය කර නිවැරදි ශේෂය ගණනය කිරීම.

# සංවර්ධන අංශය

ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියට අයත් සමස්ථ බලප්‍රදේශයෙන් ''නම්කළ බල ප්‍රදේශය'' වන හතරලියද්ද, ගලගෙදර, හාරිස්පත්තුව, පූජාපිටිය හා අකුරණ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන්, අඩු ආදායම් ලාභීන්ගේ ආර්ථිකය ගොඩනැංවීම  උදෙසා වන ආර්ථික ජීවනෝපාය සංවර්ධන වැඩසටහන්, සමාජ ආධ්‍යාත්මික සංවර්ධනය ඉලක්ක කරගත් ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ඒවායේ පසු පැවැත්මට අදාළ කටයුතු ඉටු කිරීම සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්ය භාරය වේ. මෙම අධිකාරියේ ආරම්භක වර්ෂය වන 2006 වසරේ සිට මෙම නම්කල බලප්‍රදේශය තුල සංවර්ධනය වෙනුවෙන් සුවිශාල ව්‍යාපෘති සංඛ්‍යාවක් සාර්ථකව ක්‍රියාත්මක කළ අතර, එහිදී කේන්ද්‍රිය කාර්යභාරය සංවර්ධන අංශය විසින් ඉටුකරන ලදි.

ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය පිහිටුවීමේ අරමුණු සාක්ෂාත් කරලීම උදෙසා පවතින භෞතික සහ මානව සම්පත් උපරිම ඵලදායිතාවයකින් යොදා ගනිමින් පසුගිය වසර කීපය තුළම ක්‍රියාත්මක කළ ඉලක්කගත වැඩසටහන් මගින් සාර්ථක ප්‍රතිඵල අත්කර ගෙන තිබේ. විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවගේ දරිද්‍රතාවය අඩුකරමින් ජීවන තත්වය නගාසිටුවීමට ක්‍රියාත්මක කළ එම සංවර්ධන ව්‍යාපෘති උපකාරී වී තිබීම තුලින් සංවර්ධන අංශයට සතුටු විය හැකිය. ''දිවිනැගුම'' වැඩසටහන සමග අප අධිකාරිය ද දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය කිරීමට නියමිතව තිබූ බැවින් 2011 වසරේ දී ආරම්භ කරන ලද ව්‍යාපෘති නිම කිරීම වෙනුවෙන් 2012 වසරේදී සංවර්ධන අංශය ප්‍රමුඛස්ථානය දී ක්‍රියාකරන ලදි. ඒ අනුව 2012 වර්ෂයට අවිච්ඡේද හා බැඳීම්ගත වූ ව්‍යාපෘති අවසන් කිරීමත් පසුගිය වර්ෂවල ක්‍රියාත්මක කරන ලද කෘෂිකාර්මික, පාරිසරික, පශු සම්පත්, ග්‍රාමීය සුළු කර්මාන්ත සහ අලෙවි ප්‍රවර්ධන ව්‍යාපෘතිවල පසුවිපරම් කටයුතු සිදුකිරීමටත් ක්‍රියාකරන ලදි. එයට අමතරව 2007 වසරේ සිට 2011 වසර දක්වා ප්‍රතිලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධනය වෙනුවෙන් 50% ක් ආපසු අයකරන පදනම මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති වලින් චක්‍රිය අරමුදලට ආපසු ගෙවිය යුතු හිඟ මුදල අයකරගැනීමට ක්‍රියා කිරීමත් 2012 වර්ෂයේ සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්යභාරයන් විය. සංවර්ධන අංශය මගින් 2011 වර්ෂයේ දී ඉටුකරන ලද සමස්ථ කාර්යභාරය පහත අංශ ඔස්සේ විස්තරාත්මකව ඉදිරිපත් වේ.

## 01. යටිතල පහසුකම් සංවර්ධනය

අධිකාරියේ නම්කළ බල ප්‍රදේශයේ, ග්‍රාමීය ජනතාවගේ කෘෂිකර්මාන්තයට මූලිකත්වය දෙමින් ආහාර සුරක්ෂිතතාවය සහ ග්‍රාමීය  කෘෂි ආර්ථිකය නගාසිටුවීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනයට අධිකාරිය ආරම්භයේ සිටම යොමු විය. කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන් ප්‍රමාණවත් ජලය අඛණ්ඩව ලබාදීමේ අභිලාශයෙන් සුළු වාරිමාර්ග සංවර්ධනය කිරීමට හා වෙළඳපල වෙත පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා කෘෂිමාර්ග සංවර්ධනය කිරීමට 2011 වසරේදී ප්‍රමුඛතාවය ලබාදුනි.

ක්‍රියාත්මක කරන ලද එම ව්‍යාපෘතිවලින් 2012 වසරට අවිච්ඡේද සහ බැඳීම්ගත වූ සුළු වාර්මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ සහ කෘෂි මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති අවසන් කිරීමට 2012 වසරේදී සංවර්ධන අංශයට හැකියාව ලැබිණි. එම ව්‍යාපෘතිවලට අදාල සාරාංශ විස්තරයක් පහතින් දක්වා ඇත.

**<u>2011 වසරෙන් 2012 වර්ෂයට බැඳීම්ගත වූ ව්‍යාපෘති</u>**

| අනු අංකය | ව්‍යාපෘතිය | ක්‍රියාත්මක ප්‍රා/ලේ කොට්ටාශය | ව්‍යාපෘති සංඛ්‍යාව | නිම කළ ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | සුළු වාරි මාර්ග ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය | හතරලියද්ද | 6 | 6 |
| 2 | | ගලගෙදර | 12 | 11 |
| 3 | | හාරිස්පත්තුව | 8 | 8 |
| 4 | | පුජාපිටිය | 2 | 2 |
| 5 | | අකුරණ | 2 | 2 |
| **උප එකතුව** | | | **30** | **29** |
| 1 | කෘෂි මාර්ග සංවර්ධනය | හතරලියද්ද | 11 | 11 |
| 2 | | ගලගෙදර | 23 | 18 |
| 3 | | පුජාපිටිය | 8 | 8 |
| 4 | | අකුරණ | 4 | 4 |
| **උප එකතුව** | | | **46** | **41** |
| **මුළු එකතුව** | | | **76** | **70** |

**<u>2011 වසරෙන් 2012 වර්ෂයට අවිච්ඡේද වූ ව්‍යාපෘති</u>**

| අනු අංකය | ව්‍යාපෘතිය | ක්‍රියාත්මක ප්‍රා/ලේ කොට්ඨාශය | ව්‍යාපෘති සංඛ්‍යාව | නිම කළ ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | සුළුවාරි මාර්ග ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය | හතරලියද්ද | 4 | 2 |
| 2 | | ගලගෙදර | 8 | 5 |
| 3 | | හාරිස්පත්තුව | 22 | 10 |
| 4 | | පුජාපිටිය | 31 | 20 |
| 5 | | අකුරණ | 9 | 6 |
| **උප එකතුව** | | | **74** | **43** |
| 1 | කෘෂි මාර්ග සංවර්ධනය | හතරලියද්ද | 14 | 8 |
| 2 | | ගලගෙදර | 49 | 37 |
| 3 | | හාරිස්පත්තුව | 5 | 3 |
| 4 | | පුජාපිටිය | 7 | 5 |
| 5 | | අකුරණ | 11 | 7 |
| **උප එකතුව** | | | **86** | **60** |
| **මුළු එකතුව** | | | **160** | **103** |

## සංවර්ධනය කළ ව්‍යාපෘති කිහිපයක්

### සුළු වාර්මාර්ග



කුඹුක වෙල්යායේ පැතිබැම්ම ඉදිකිරීම - පූජාපිටිය



නාරංගස්කුඹුර අරළුපොතේ යාය වාරි ඇළ ඉදිකිරීම - හාරිස්පත්තුව



විගුහුම්පල ගල්අමුණ යාය ඇල වේල්ල සංවර්ධනය කිරීම - හාරිස්පත්තුව



කොහොවිලදෙණිය අමුණ ඉදිකිරීම - ගලගෙදර

### කෘෂි මාර්ග



**හල්ඔළුව එරමුදුගොල්ල කෘෂි මාර්ගය හා පාලම සංවර්ධනය කිරීම හාරිස්පත්තුව**



**අස්වැද්දුම යාය කෘෂිමාර්ගය සංවර්ධනය කිරීම- හාරිස්පත්තුව**



කන්දේකුඹුර මොරගොල්ල කෘෂි මාර්ගය සංවර්ධනය කිරීම - ගලගෙදර



ඉරිවේරියගල අංග කෘෂි මාර්ගය සංවර්ධනය කිරීම - ගලගෙදර

## 02. ජීවනෝපාය සංවර්ධනය

දිළිඳුකමින් තොර ශ්‍රී ලංකාවක් 2015 දී බිහිකිරීම අතිගරු ජනාධිපතිතුමාගේ එක් උදාර අරමුණකි. දිළිඳුකම තුරන් කිරීමේ වැඩසටහන්වලදී ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති බහුලව දක්නට ලැබේ. ආදායම් උත්පාදනය, දරිද්‍රතාව අඩුකිරීම, ජීවන මට්ටම ඉහළ නැංවීම යන ක්‍රියාදාමයන්ට ඇතුලත්වන ව්‍යාපෘති රැසක් ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය 2006 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරමින් සිටී.

2012 වර්ෂයට ලැබුණු ප්‍රතිපාදන අනුව නව ව්‍යාපෘති ආරම්භ කිරීමක් සිදු නොකල අතර, මෙම අධිකාරියේ මැදිහත්වීමෙන් පසුගිය වසර කිහිපය තුළ ආරම්භ කර තිබූ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළ පසු විපරම් කටයුතු කරමින් ඒවායේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලදි. ඒ යටතේ,

- 2011 වර්ෂයේ ගලගෙදර, හාරිස්පත්තුව, පූජාපිටිය හා අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ක්‍රියාත්මක කරන ලද කහ සහ ඉඟුරු වගාව නිරන්තර පසු විපරම් සිදු කිරීම. එමගින් ඒවායේ නිෂ්පාදන ප්‍රමාණය වැඩිකිරීම හා ප්‍රමිතිය හා ගුණාත්මක බව ඉහළ නැංවීමට ප්‍රතිලාභීන් සංවිධානාත්මකව කටයුතු කරවීමට යොමු කරවීම.
- 2011 වර්ෂයේ හතරලියද්ද, ගලගෙදර, හාරිස්පත්තුව, පූජාපිටිය හා අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ක්‍රියාත්මක කරන ලද පාසල් පාරිසරික වැඩසටහනේ සහ ඔසු උයන් පිහිටුවීමේ වැඩසටහනේ පසු විපරම් සිදු කරමින් ඒවා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට උනන්දු කිරීම මගින් මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් '' ගහකොළ සහ සතා සීපාවා ද සුරකින හරිත ලංකාවක් '' යන අභිමතාර්ථය ජයගැනීමට පාසල් හා ප්‍රජා මට්ටමේ දායකත්වයක් මෙම අධිකාරියේ ක්‍රියාත්මක බල ප්‍රදේශයෙන් සහතික කිරීමට දායක වීම.

- 2011 වර්ෂයේ හතරලියද්ද, ගලගෙදර, හාරිස්පත්තුව, පූජාපිටිය හා අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ක්‍රියාත්මක කරන ලද මී මැසි පාලන ව්‍යාපෘතියේ පසු විපරම් සිදු කිරීම සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම, එමගින් දේශීය පිරිසිදු මී පැණි නිෂ්පාදන වෙළඳපලට එක් කිරීමටත්, ගෘහ ආර්ථිකයට අතිරේක ආදායමක් එක් කරගත හැකි ජීවනෝපායක් වශයෙන් මී පැණි නිෂ්පාදනය ජනප්‍රිය කිරීමටත්, වගාවට හිතකර සත්ව විශේෂයක් ලෙස එම ප්‍රදේශවල මී මැසි ගහණය වර්ධනය කිරීමටත් හැකියාව ලැබුණි.

- 2011 වර්ෂයේ ඉහත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ක්‍රියාත්මක කරන ලද අපනයන කෘෂි භෝග වගාව, ගෙවතු වගාව සහ පලතුරු වගාව වැනි කෘෂිකාර්මික ව්‍යාපෘතිවල පසුවිපරම් සිදුකරමින් ඒවාට සම්බන්ධ ප්‍රතිලාභීන් උනන්දු කරමින් එම ව්‍යාපෘති අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට දායක වීම. මෙමගින් එම ප්‍රදේශ තුළ ඇති ප්‍රධාන කෘෂිකාර්මික නිෂ්පාදකයන්ගේ නිෂ්පාදන ප්‍රමාණය වැඩි කිරීම හා ඒවායේ ප්‍රමිතිය ඉහළ නැංවීමට හැකියාව ලැබුණි.



පාසල් පාරිසරික වැඩසටහන පසුවිපරම් කිරීම - සංඝරාජපුර මහා විද්‍යාලය, හතරලියද්ද

- ගලගෙදර, හාරිස්පත්තුව සහ පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල 2011 වසරේදී ක්‍රියාත්මක කරන ලද රූපලාවන්‍ය හා කරනවෑම් ස්වයං රැකියාමය ජීවනෝපාය කර්මාන්ත සඳහා උපකරණ ලබාදුන් ප්‍රතිලාභීන්ගේ පසු විපරම් කටයුතු සිදු කිරීම. එමගින් ගෘහිනියන්ට අතිරේක ආදායම් මාර්ගයක් සංවිධානය කිරීම සහ රූපලාවන්‍යය, ජීවනෝපාය මාර්ගයක් ලෙස ප්‍රදේශයේ ජනප්‍රිය කිරීමට හැකියාව ලැබුණි.

- 2007 වසරේ සිට 2011 වසර දක්වා අධිකාරියේ මුදල් යොදවා ආරම්භ කරන ලද ආදායම් උත්පාදන ව්‍යාපෘතිවලින් අයකරගත යුතුව තිබූ 50% චක්‍රිය අරමුදල් අධිකාරියට ආපසු අයකිරීමට කටයුතු කිරීම හා එම ව්‍යාපෘතිවල පසු පැවැත්මට අවශ්‍ය අමතර සේවා සැපයීම.

- පේරාදෙණිය උද්භිද උද්‍යාන පරිශ්‍රයේ අධිකාරිය මගින් පිහිටුවන ලද ''දිවිනැගුම පැල අලෙවිසැල'' අඛණ්ඩව පවත්වාගෙන යාම සහ එමගින් උසස් තත්වයෙන් යුතු පලතුරු පැල, එළවළු පැල, අපනයන කෘෂිභෝග පැල, ඖෂධ පැල, පොල් පැල සහ දැවමය පැල සාධාරණ මිලට අලෙවි කිරීම හා දිවයිනේ නන් දෙසින් පැමිණෙන පිරිස් වෙත උසස් තත්වයේ පැල වර්ග සාධාරණ මිලකට සැපයීමට මෙයින් හැකිව තිබෙන අතර, මෙම අධිකාරියට අතිරේක ආදායමක් උපයා ගැනීමේ අවස්ථාව මෙමගින් සැලසී තිබේ.

## 03. ආධ්‍යාත්මික හා සමාජ සංවර්ධනය

ග්‍රාමීය ජනතාවගේ ආගමික, සංස්කෘතික, සෞඛ්‍ය සහ පාරිසරික ගුණවගාවන් සංවර්ධනය කිරීමේ අරමුණ පෙරදැරි කරගෙන ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය පිහිටවූ 2006 වසරේ සිට විශේෂයෙන්ම නම්කළ බල ප්‍රදේශය වන ඉහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 තුළ පිහිටි ග්‍රාම නිලධාරි වසම් 310 ආවරණය වන පරිදි ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. 2011 වසරින් වෙන්කරගත් මූල්‍ය ප්‍රතිපාදන යොදාගනිමින් දහම් පාසල් අධ්‍යාපනය සංවර්ධනය කිරීම, සනීපාරක්ෂක පහසුකම් ප්‍රවර්ධනය කිරීම, කලායතන සංවර්ධනය කිරීම, මාතෘ සායන වැඩිදියුණු කිරීම සහ තොරතුරු තාක්ෂණ හැකියාව වර්ධනය කිරීම වැනි වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල සාරාංශගත ප්‍රගතිය පහතින් ඉදිරිපත් කෙරේ.

### ❖ දහම් පාසල් අධ්‍යාපනය සංවර්ධනය කිරීමේ වැඩසටහන

2011 වර්ෂයෙන් වෙන්කරගන්නා ලද මූල්‍ය ප්‍රතිපාදන මත ග්‍රාමීය ජනතාවගේ දරුවන් සඳහා දහම් පාසල් අධ්‍යාපනය වැඩිදියුණු කිරීමට අවශ්‍ය භෞතික පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන් 2012 වර්ෂයේදී ප්‍රමුඛතාවය ලබාදුනි. එම ව්‍යාපෘති යටතේ බෞද්ධ දහම් පාසල් 168 ක් සහ ඉස්ලාම් දහම් පාසල් 11 ක් සඳහා ඩෙස්ක්, බංකු, ලිපිගොනු අල්මාරි, කළු ලෑලි, සනීපාරක්ෂක පහසුකම් සහ වයිට් බෝඩ් ලබාදීම තුම්පනේ, හාරිස්පත්තුව, පූජාපිටිය සහ අකුරණ යන ප්‍රාදේශීය සභාවන් සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කර අවසන් කරන ලදි. මෙමගින් ඉහත ආගමික ආයතනවල කාලයක සිට පැවති භෞතික සම්පත් හිගය සපුරාලීම තුලින් ගුණාත්මක දහම් අධ්‍යාපනයකට අවශ්‍ය හිතකාමී පරිසරයක් එම ආයතන තුළ ඇතිකිරීමට දායකවීමට හැකි විය. මේ යටතේ බෙදා දුන් භාණ්ඩ පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

## දහම් පාසල් සංවර්ධන ව්‍යාපෘතිය

| අනු අංකය | ප්‍රා/ලේ කොට්ඨාශය | බෞද්ධ දහම් පාසල් සංඛ්‍යාව | උපකරණ ලබා දුන් දහම් පාසල් සංඛ්‍යාව | | ලබා දුන් භාණ්ඩ ප්‍රමාණය | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | බෞද්ධ | මුස්ලිම් | ඩෙස් | බංකු | කළුලෑලි | පුස්තකාල අල්මාරි | ලිපිගොනු අල්මාරි | වයිට් බෝඩ් | ළමා/කාර්යාල මේස | ළමා පුටු | ගුරු පුටු | සෙවිලි තහඩු |
| 1 | හතරලියද්ද | 31 | 24 | 2 | 373 | 38 | 28 | 9 | | 62 | | | | |
| 2 | ගලගෙදර | 28 | 26 | 1 | 241 | 241 | 29 | - | 32 | 51 | 60 | 30 | 20 | 20 |
| 3 | හාරිස්පත්තුව | 57 | 57 | 2 | 597 | 567 | 51 | - | 37 | 205 | - | - | 1 | - |
| 4 | පූජාපිටිය | 44 | 44 | 0 | 421 | 411 | 36 | - | - | 62 | - | 12 | - | - |
| 5 | අකුරණ | 17 | 17 | 6 | 196 | 126 | 12 | 1 | 27 | 36 | 1 | | - | - |
| **එකතුව** | | **177** | **168** | **11** | **1828** | **1383** | **156** | **10** | **96** | **416** | **61** | **42** | **21** | **20** |




**දහම්පාසල් සඳහා උපකරණ ලබාදීම**

## ❖ සනීපාරක්‍ෂක පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

2011 වර්ෂයෙන් වෙන් කරගන්නා ලද මූල්‍ය ප්‍රතිපාදන යොදාගෙන හාරිස්පත්තුව, පූජාපිටිය සහ අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල පාචනය වැනි බෝවන රෝග අවම කිරීමත්, නිතර උද්ගත වන ඩෙංගු වැනි මදුරුවන්ගෙන් බෝවන මාරාන්තික රෝග තත්වයන් අවම කිරීමත්, හොඳ සෞඛ්‍ය පුරුදු ප්‍රජාව අතර භාවිතය වැඩි දියුණු කිරීම සඳහාත් සනීපාරක්ෂක පහසුකම් නොමැති පවුල් 413 ක්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්, ග්‍රාම නිලධාරීන් සහ සමෘද්ධි නිලධාරීන් මගින් තෝරාගෙන සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහනක් අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ප්‍රාදේශීය සභාවන් හරහා 2012 වසරේදී ක්‍රියාත්මක කර අවසන් කරන ලදි. මෙම වැඩසටහන යටතේ,

- හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පවුල් 130 ක් සඳහා සිමෙන්ති කොට්ට 650 ක්, සිමෙන්ති බ්ලොක් ගල් 14,300 ක්, වහලයට රැලි තහඩු 390 ක් සහ ස්කොටින් පෑන් (ජල මුද්‍රිත වැසිකිලි පෝච්චි 130 ක් ලබාදීම සඳහා රුපියල් 1,635,166.00 ක් වැය කරන ලදි.
- පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පවුල් 127 ක් සඳහා සිමෙන්ති කොට්ට 635 ක්, සිමෙන්ති බ්ලොක් ගල් 13,970 ක්, වහල සඳහා රැලි තහඩු 381 ක් සහ ස්කොටින් පෑන් (ජල මුද්‍රිත වැසිකිළි පෝච්චි) 127 ක් ලබා දීම සඳහා රුපියල් 1,597,431.40 ක් වැය කරන ලදි.
- අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පවුල් 156 ක් සඳහා සිමෙන්ති කොට්ට 780 ක්, සිමෙන්ති බ්ලොක් ගල් 17,160 ක්, වහල සඳහා රැලි තහඩු 468 ක් සහ ස්කොටින් පෑන් (ජල මුද්‍රිත වැසිකිලි පොච්චි) 156 ක් ලබාදීම සඳහා රුපියල් 1,962,199.20 ක් වැය කරන ලදි.

## ❖ මාතෘ සායන සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

2011 වර්ෂයෙන් අවිච්ඡේද වූ මාතෘ සායන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අළුදෙණිය මාතෘ සායන මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම සඳහා රුපියල් 689,348.85 ක් සහ සායන පුටු 36 ක් ලබාදීමෙ සඳහා රු.126,000 ක මුදලක් වැය කරන ලදි.





### ❖ තොරතුරු තාක්‍ෂණ හැකියාව වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

2011 වර්ෂයෙන් වෙන් කරගන්නා ලද මූල්‍ය ප්‍රතිපාදන යොදාගෙන හතරලියද්ද, ගලගෙදර සහ පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල රාජ්‍ය නිලධාරීන්ගේ, තරුණ තරුණියන්ගේ සහ ප්‍රදේශයේ දරුවන්ගේ තොරතුරු තාක්‍ෂණ හැකියාව වර්ධනය කිරීමේ අභිලාෂයෙන් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ප්‍රාදේශීය සභා මගින් 2012 වසරේදී තොරතුරු තාක්‍ෂණ හැකියාව වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි. මේ යටතේ,

- රුපියල් 1,277,130.00 ක ආයෝජනයෙන් මල්ටිමීඩියා හා පරිගණක පහසුකම් සහිත අංග සම්පූර්ණ පරිගණක මධ්‍යස්ථානයක් හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ස්ථාපිත කරනු ලැබිණ. මේ සඳහා ඩෙස්ක්ටොප් පරිගණක යන්ත්‍ර 10 ක්, ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 03 ක්, විදුලි ආරක්ෂණ යූ.පී.එස්. උපාංග 10 ක්, ලේසර් මුද්‍රණ යන්ත්‍ර 01 ක්, ස්කෑනර් යන්ත්‍ර 01 ක්, මල්ටි මීඩියා ප්‍රොජෙක්ටර් 01 ක්, ඩිජිටල් කැමරා 01 ක්, පරිගණක මේස 10 ක් හා ඒ සඳහා පුටු 10 ක් ලබාදීමට කටයුතු කරනු ලැබිණ.

- රුපියල් 1,377,073.00 ක ආයෝජනයෙන් මල්ටිමීඩියා හා පරිගණක පහසුකම් සහිත අංග සම්පූර්ණ පරිගණක මධ්‍යස්ථානයක් ගලගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ස්ථාපිත කිරීමට කටයුතු කළ අතර, මෙම පරිගණක මධ්‍යස්ථානයේ කටයුතු වඩාත් කාර්යක්‍ෂම කිරීම සඳහා ඩෙස්ක්ටොප් පරිගණක යන්ත්‍ර 10 ක්, ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 03 ක්, වයිට් බෝර්ඩ් 01 ක්, වානේ අල්මාරි 01 ක්, සම්මන්ත්‍රණ ශාලා පුටු 10 ක්, ෆයිල් කබඩ් 01 ක්, විධායක මේස02 ක්, විධායක පුටු 02 ක්, පරිගණක පුටු 10 ක්, පරිගණක මේස 10 ක්, ඩිජිටල් කැමරා 01 ක්, මල්ටි මීඩියා ප්‍රොජෙක්ටර් 01 ක්, ස්කෑනර් යන්ත්‍ර 01 ක්, ලේසර් මුද්‍රණ යන්ත්‍ර 01 ක් හා විදුලි ආරක්ෂණ (යූ.පී.එස්.) උපාංග 10 ක් ලබාදෙනු ලැබිණ.

- පූජාපිටිය ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යන පරිගණක මධ්‍යස්ථානයේ අධ්‍යාපන පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය මගින් ඩෙස්ක්ටොප් පරිගණක 10 ක් සමග යූ.පී.එස්. යන්ත්‍ර 10 ක්, ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 02 ක්, මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් 01ක්, ලේසර් මුද්‍රණ යන්ත්‍ර 04 ක්, ස්කෑනර් යන්ත්‍ර 01 ක්, ඩිජිටල් කැමරා 01 ක්, පරිගණක මේස 10 ක් හා ඒ සඳහා අවශ්‍ය වන පුටු 10 ක් ලබාදීමට කටයුතු කළ අතර මේ සඳහා රුපියල් 1,218,080.00 ක මුදලක් වැය කරනු ලැබිණ.


ඉහත පරිගණක අධ්‍යාපන මධ්‍යස්ථාන මගින් හතරලියද්ද, ගලගෙදර හා පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල වෙසෙන තරුණ තරුණියන් හා පාසල් හැර යන්නන් සඳහා තම ප්‍රදේශය තුළින්ම වෘත්තීය පුහුණුවක් ලෙස තොරතුරු තාක්ෂණ දැනුම ලබාදීමට අවශ්‍ය භෞතික පහසුකම් සැපයීම ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ අපේක්ෂිත අරමුණ විය. මෙමගින් එම ප්‍රදේශවල ජීවත්වන රැකියා විරහිත තරුණ තරුණියන් හා පාසල් හැර යන්නන් සඳහා තොරතුරු තාක්ෂණය ආශ්‍රිතව දැනුම ලබාගැනීමට පහසු ප්‍රවේශයක් ලැබී තිබෙන අතර, එය

ඔවුන්ගේ ශ්‍රම ඵලදායීත්තාවය වර්ධනය කරවීමටත් වර්තමාන රැකියා වෙළඳපලේ පවත්නා වෘත්තීය ක්ෂේත්‍ර වෙත යොමු වීමටත් පහසු වී තිබේ.





පරිගණක අධ්‍යාපන මධ්‍යස්ථානය - ගලගෙදර ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල





පරිගණක අධ්‍යාපන මධ්‍යස්ථානය - හතරලියද්ද ප්‍රාදේශීය සභා උප කාර්යාලය

❖ **පාරම්පරික දේශීය කලායතන සංවර්ධනය කිරීමේ වැඩසටහන**

- උඩරට ප්‍රදේශයේ පාරම්පරික උරුමයක් වන සාම්ප්‍රදායික නර්තන හා වාදන කලාවන් රැකගැනීම හා සංවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය මගින් 2011 වර්ෂයේදී ආරම්භ කරන ලද දේශීය සාම්ප්‍රදායික කලායතන සංවර්ධනය කිරීමේ වැඩසටහන 2012 වර්ෂයේ දී සාර්ථකව ක්‍රියාත්මක කර අවසන් කරන ලදි. මෙම වැඩසටහන යටතේ හතරලියද්ද, ගලගෙදර, හාරිස්පත්තුව, පූජාපිටිය සහ අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ පිහිටි

කලායතන 24 ක් එම කොට්ඨාශවල සංස්කෘතික නිලධාරීන්ගේ නිර්දේශය මත තෝරා ගෙන අවශ්‍යතාවය අනුව නර්තන උපාංග හා වාද්‍ය භාණ්ඩ ලබාදීමට කටයුතු කරන ලදි. මේ සඳහා රුපියල් 976,095.00 ක මුදලක් මෙම අධිකාරිය මගින් ආයෝජනය කරනු ලැබිණ. මෙමගින් වර්තමානයේ පරිහානියට පත්වෙමින් තිබෙන දේශිය උඩරට පාරම්පරික කලා ශිල්ප ඉදිරි ළමා පරපුර වෙත දායක කිරීමට අවම භෞතික හා මූල්‍ය පහසුකම් යටතේ විශාල මෙහෙයක් ඉටුකරනු ලබන දේශීය පාරම්පරික කලා ආයතන සංවර්ධනය කිරීමට දායකත්වයක් ලබාදීමට අප අධිකාරියට හැකි විය. එබැවින් මෙම වැඩසටහන සංස්කෘතික උරුමයන් පරිහානියට පත්වීමට ඉඩනොදී ආරක්ෂා කරගැනීම සඳහා ඉදිරිපත්ව සිටින කලායතන ආරක්ෂා කිරීමටත්, රැකගැනීමටත් අවශ්‍ය ආධාර සැපයූ සාර්ථක වැඩසටහනක් විය.



ශ්‍රී ලංකා දේශීය කලායතනය - හාරිස්පත්තුව



ප්‍රදීපිකා රංගන කලායතනය - ගලගෙදර

# පශු සම්පත් සංවර්ධන වැඩසටහන

මෙම අධිකාරිය ඉදිරියේ දී ස්ථාපනය වීමට නියමිත දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය වීමට නියමිත ආයතනයක් බැවින් 2012 වර්ෂය සඳහා නව ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන නොලද අතර, 2011.09.19 දින සහකාර අධ්‍යක්ෂවරයෙකු බඳවා ගැනීමෙන් පසු අරඹන ලද කිරිගව පාලන, එළු පාලන හා කුකුළු පාලන යන සත්ව පාලන ව්‍යාපෘතිවලට අදාළව ඉදිරි කටයුතු හා පසුවිපරම් කටයුතු මෙම වර්ෂයේ දී සිදු කරන ලදි.

2011 වර්ෂයේ සැලසුම් කරන ලද ව්‍යාපෘති වලට අදාළව කිරිගවයින්, එළුවන් හා කුකුළු පැටවුන් මිළදී ගැනීම සඳහා ඇණවුම් භාර දෙන ලද ආයතන විසින් නියමිත කාල රාමුව තුළ සැපයීම් සිදු නොකිරීම මත එම සතුන් බෙදා දී අවසන් කිරීම 2012 වර්ෂය තුළ දී සිදු කරන ලදි.

| අනු අංකය | සතුන් වර්ගය | ප්‍රතිලාභින් සංඛ්‍යාව | ලබාදුන් සතුන් ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | කිරිගවයින් | 52 | 52 |
| 02 | එළුවන් | 55 | 165 |
| 03 | ගම් කුකුළන් | 252 | 3024 |







තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා කිරි ගවයන් බෙදා දීම






තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා එළුවන් බෙදා දීම

මීට අමතරව කිරිගවයින් බෙදා දෙන ලද සෑම ප්‍රතිලාභියෙකු සඳහාම සෞඛ්‍යාරක්ෂිතව කිරි එකතුකොට ප්‍රවාහනය කිරීම සඳහා ලීටර් 10 කිරි භාජනය බැගින් මුළු කිරිභාජන 52 ක් බෙදා දෙන ලදි.




කිරිගව පාලන ව්‍යාපෘතිය යටතේ කිරි එකතුකිරීමේ භාජන බෙදා දීම

කිරිගව පාලන ව්‍යාපෘතිය යටතේ සෑම ප්‍රතිලාභියෙකු වෙතම බෝපත්තලාව හා මැණික් පාලම ගොවිපලවලදී අභිජනනය කරන ලද ප්‍රීෂියන් වර්ගයේ එළ ගව වැස්සියක් බැගින් ලබාදෙන අතර, එළු පාලන ව්‍යාපෘතිය යටතේ සෑම ප්‍රතිලාභියෙකු සඳහාම ජම්නාපාරි හා සනන් වර්ගයේ එළුවන් තිදෙනෙකු (පිරිමි 1/ ගැහැණු 2) බැගින් ද බෙදා දෙන ලදි. ගම් කුකුළු පාලන ව්‍යාපෘතිය යටතේ එක් ප්‍රතිලාභියෙකු සඳහා කුකුළු පැටවුන් 02 ක් ද, කිකිළි පැටවුන් 10 ක් ද, වශයෙන් මසක් වයසැති පැටවුන් 12 දෙනෙකු බැගින් ලබා දෙන ලදි.

| අනු අංකය | සතුන්/භාණ්ඩ වර්ගය | බෙදා දෙන ලද සතුන් හා භාණ්ඩ සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|---|
| | | හතරලියද්ද | ගලගෙදර | හාරිස්පත්තුව | පූජාපිටිය | අකුරණ |
| 01 | ගවයින් | 13 | 09 | 08 | 11 | 11 |
| 02 | එළුවන් | 30 | 42 | 30 | 24 | 39 |
| 03 | ගම් කුකුළන් | 348 | 924 | 468 | 312 | 972 |
| 04 | කිරි භාජන | 13 | 09 | 08 | 11 | 11 |

කිරිගව පාලන ව්‍යාපෘතිය හා (2011 වර්ෂයේ දී බෙදා දෙන ලද ගවගාල් ආධාර ද ඇතුලත්ව) එළු පාලන ව්‍යාපෘතිය 50% චක්‍රිය අරමුදල් ක්‍රමය යටතේ ක්‍රියාත්මක කළ අතර, ගම් කුකුළු පාලන ව්‍යාපෘතිය හා කිරිභාජන බෙදා දීම නොමිලයේ සිදු කරන ලදි. කිරිගව පාලන ව්‍යාපෘතිය යටතේ පැටවුන් බිහිවීම ආරම්භ වී ඇති අතර, උසස් ආරයේ නිරෝගී පැටවුන් හා කිරි ලබා ගැනීමට ප්‍රතිලාභීන්ට හැකි වී ඇත.




කිරි ගව පාලන ව්‍යාපෘතියේ වත්මන් ප්‍රගතිය




එළු පාලන ව්‍යාපෘතියේ වත්මන් ප්‍රගතිය

ගම්කුකුළු පාලන ව්‍යාපෘතිය වත්මන් ප්‍රගතිය.

මේ අනුව සැලසුම් සකස් කළ පරිදි සත්ව පාලන ව්‍යාපෘති සියල්ල 2012 වසර තුලදී සාර්ථකව ක්‍රියාවට නැංවීමට හැකිවිය.

## ඉංජිනේරු අංශය

ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළව ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තු හා තාක්ෂණික ලියකියවිලි පිළියෙල කිරීම හා තාක්ෂණික තත්ව පාලනය, ප්‍රමිතීන් අධීක්ෂණය සිදු කිරීම, ටෙන්ඩර් පටිපාටියෙහි තාක්ෂණ ඇගයීම, වැඩබිම් පරීක්ෂා කිරීම්. අදාළ බිල්පත් පරීක්ෂා කිරීම සහ නිර්දේශ කිරීම ඉංජිනේරු අංශයට අදාළ මූලික වගකීම වේ.

### 2012 වර්ෂය - ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

2011 වසරේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ දේශීය කෘෂිකර්මාන්තය නැංවීමට අදාළව සිදුකළ සුළු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘති 340 න් සහ කෘෂි මාර්ග 337 න් 2012 වර්ෂය සඳහා අඛණ්ඩ වූ ව්‍යාපෘතීන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින්

පහත සඳහන් පරිදි වේ. එම ව්‍යාපෘතීන් සඳහා අදාල බිල්පත් සහ ඉදිකිරීම්වල ප්‍රමිතීන් පරීක්‍ෂා කර ගෙවීම් නිර්දේශ කිරීම සිදුකරන ලදි.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | අවිච්ඡේද ව්‍යාපෘති | | බැඳීම්ගත ව්‍යාපෘති | |
|---|---|---|---|---|
| | කෘෂි මාර්ග | වාරි මාර්ග | කෘෂි මාර්ග | වාරි මාර්ග |
| හතරලියද්ද | 14 | 04 | 11 | 06 |
| තුම්පනේ | 49 | 08 | 23 | 12 |
| හාරිස්පත්තුව | 05 | 22 | - | 08 |
| පූජාපිටිය | 07 | 31 | 08 | 02 |
| අකුරණ | 11 | 09 | 04 | 02 |

## නොනිම් ව්‍යාපෘති

2006, 2007 හා 2008 යන වසරවල දී ආරම්භ කරන නමුත් එම ඉදිකිරීම් අවසන් කර නොතිබූ ව්‍යාපෘති රැසක් අතිගරු ජනාධිපතිතුමන්ගේ සංකල්පයට අනුව ක්‍රියාත්මක කරන ලද ''නොනිම් ව්‍යාපෘති ඉදිකිරීම් අවසන් කිරීමේ වැඩ සටහන'' යටතේ ප්‍රාදේශීය දේශපාලන අධිකාරියේ සහ ප්‍රජාවගේ ද බලවත් ඉල්ලීම පරිදි ඉදිකර අවසන් කිරීමට අප අධිකාරිය විසින් 2011 වරෂයේදී පියවර ගන්නා ලදි. එහෙත් පැවැති කාළගුණික තත්වයන් සහ මතු වූ ප්‍රායෝගික ගැටළු කිහිපයකුත් හේතුවෙන් 2011 වර්ෂයේ දී ඉදිකිරීම් අවසන් කිරීමට නොහැකි වූ ව්‍යාපෘති 07 ක ඉදිකිරීම් 2012 වර්ෂය තුල අවසන් කිරීමට කටයුතු කරන ලදි. ඒ අනුව වසර කිහිපයක් අතරමග නවතා තිබූ ව්‍යාපෘති රැසක ඉදිකිරීම් අවසන් කර එම ව්‍යාපෘති මගින් ජනතාවට ප්‍රතිලාභ ලබා ගැනීමට අවස්ථාව සළසා දෙමින් රටේ සංවර්ධනයට විශාල දායකත්වයක් ලබා දීමට අප අධිකාරියට හැකි විය.

### 1. හතරලියද්ද නාරංගස්පිටිය වීවල පාලම ඉදිකිරීම

නාරංගස්පිටිය, අක්කරවත්ත, දෙහිඅත්තේමඩ, වීවල, වෙලගම ආදි අති දුෂ්කර කෘෂි ගම්මාන රැසක් මැදින් ගලායන රඹුක්කන් ඔය හේතුවෙන් මෙම ගම්මාන කාලයක් තිස්සේ හුදකලා වී තිබුණි. මෙම ඔය හරහා පාලමක් ඉදිකරගැනීමේ විශාල උත්සහයක ප්‍රදේශවාසීන් යෙදී තිබුණ ද එම ප්‍රයත්නයන් අසාරථක වී ඇත. ඔය හරහා ගමන් කිරීමේ දී අනතුරකට පත්වී ඇති පාසැල් දරු දැරියන් මෙන්ම වැඩිහිටියන් ද විශාල පිරිසකි. ජනතාවට ගමනාගමන පහසුකම් සලසාදීම මෙන්ම ප්‍රදේශයේ ආර්ථික හා සමාජයීය සංවර්ධනය ද අපේක්‍ෂා කරමින් මෙම ව්‍යාපෘතිය 2009 වසරේ ආරම්භ කළ ද මතු වූ දුෂ්කරතා හේතුවෙන් ඉදිකිරීම් කටයුතු අතර මඟ නැවැත්වීමට සිදු වූ නමුත් 2012 වර්ෂයේ දී මෙහි ඉදිකිරීම් නැවත ආරම්භ කර කඩිනම් කිරීමට පියවර ගන්නා ලදි. ව්‍යාපෘතියේ සමස්ත ඇස්තමේන්තු මුදල රු.මිලියන 13.89 ක් වන මෙහි 2680 ක් පමණ වූ ප්‍රතිලාභීන්ට

පැන නැගුන ගමනාගමන දුෂ්කරතාවයන් නිමා කිරීමේ අරමුණින් වැඩ අවසන් කිරීමට සැළසුම් කළ ද පාලම සඳහා තිබූ පටු පිවිසුම් මාර්ගය පුළුල් කර දෙන ලෙසට ප්‍රාදේශීය දේශපාලන අධිකාරිය මෙන්ම ප්‍රදේශයේ ජනතාවද කරන ලද ඉල්ලීම මත පිවිසුම් මාර්ගය ද ඉදිකිරීමට සිදු විය. ඒ අනුව 2012 වර්ෂයේ දී ව්‍යාපෘතියේ සමස්ථ ඉදිකිරීම් අවසන් කිරීමට නොහැකි විය. කෙසේ වුවද 2012 වර්ෂයේ දී 95% ක් පමණ ඉදිකිරීම් අවසන් කර ඇත. මේ සඳහා මෙම වසර තුල රුපියල් මිලියන 8.75 ක් ආයෝජනය කර ඇති අතර 2013 අප්‍රේල් මාසයේ දී මෙහි ඉතිරි ඉදිකිරීම් අවසන් කර තුම්පනේ ප්‍රාදේශීය සභාව වෙත පැවරීමට නියමිතව ඇත. මේ අනුව ප්‍රදේශයේ ජනතාවට වසර ගණනාවක සිට තිබූ ගැටළු රැසකට සාර්ථක විසඳුම් ලබා දීමටත් එමගින් ප්‍රදේශයේ ආර්ථික හා සමාජයීය සංවර්ධනයට මෙන්ම රටේ සංවර්ධනයටත් විශාල දායකත්වයක් ලබා දීමට ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියට හැකියාව ලැබී ඇත.




වීවල පාලම - හතරලියද්ද

**2. හතරලියද්ද නාරංගස්පිටිය වීවල පාලමේ පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම.**

අප අධිකාරියේ විසින් හතරලියද්ද නාරංගස්පිටිය වීවල පාලමේ ඉදිකිරීම් ආරම්භ කිරීමත් සමග ඒ සඳහා තිබූ පටු ප්‍රවේශ මාර්ගය ද පුළුල් කර වැඩිදියුණු කර දෙන ලෙස ප්‍රදේශවාසී ජනතාවගේ මෙන්ම දේශපාලන අධිකාරියේ ද විශාල ඉල්ලීමක් විය. එමෙන්ම මෙම පාලම ඉදි කිරීමත් සමග යා වෙන නාරංගස්පිටිය, වීවල ගම්මානවල ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතාවයන් වෙනුවෙන් විශාල වාහන ප්‍රමාණයක් ගමන් කිරීම සිදුවන බැවින් එම පටු මාර්ගය පුළුල් කිරීම අත්‍යාවශ්‍ය කරුණක් විය. මාර්ගය පුළුල් කිරීමට අවශ්‍ය ඉඩම් ප්‍රදේශවාසී ජනතාව විසින් ස්ව කැමැත්තෙන් පරිත්‍යාග කිරීමට ඉදිරිපත් විය. ඒ අනුව මෙතෙක් පැවැති පටු මාර්ගය අඩි 12 - 14 ක් පමණ පුළුල් කර දිග මීටර් 235 ක් ද, පළලමීටර් 3 ක් සහ ඝනකම මිලිමීටර් 150 ක් ලෙස ඉතා ශක්තිමත් අයුරින් කොන්ක්‍රීට් අතුරා ඉදි කිරීමට කටයුතු කර ඇත. මේ සඳහා සකස් කරන ලද ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 1.83 ක් වන අතර සිවිල් වැඩ වටිනාකම රු.මිලියන 1.65 ක් විය. මේ වන විට

ව්‍යාපෘතියේ සමස්ථ ඉදිකිරීම්වලින් 85% ක් පමණ අවසන් කර ඇති අතර, 2013 අප්‍රේල් මාසය වන විට වීවල පාලමේ ඉදිකිරීම් අවසන් කිරීමට සමගාමීව මෙහි ඉතිරි ඉදිකිරීම් ද අවසන් කර තුම්පනේ ප්‍රාදේශීය සභාව වෙත පවරා ජනතා අයිතියට පැවරීමට නියමිතව ඇත. මේ අනුව පාලම ඉදිකිරීමට සමගාමීව ප්‍රවේශ මාර්ගය ද ඉදිකිරීම තුලින් ප්‍රදේශයේ ජනතාවගේ දෛනික ගමනාගමන කටයුතු වෙනුවෙන් යටිතල පහසුකම් සංවර්ධනය කර දෙමින් විශාල ජනතා මෙහෙවරක් කිරීමට ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියට හැකි විය.




වීවල පාලමේ ප්‍රවේශ මාර්ගය

**3. උඩුනුවර හියරාපිටිය නාගහමුල හොරේකොටේ මාර්ගය සංවර්ධනය කිරීම.**

ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය විසින් ප්‍රතිපාදන සපයා 2008 වර්ෂයේ දී ගම නැගුම වැඩසටහන යටතේ මෙහි ඉදිකිරීම් ආරම්භ කරන ලද නමුත් ජනතාවට එහි ප්‍රතිලාභ ලබාගත හැකි අයුරින් ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. ඒ අනුව නොනිමි ව්‍යාපෘති ව්‍යාපෘති ඉදිකිරීම් අවසන් කිරීමේ වැඩසටහන යටතේ 2012 වර්ෂයේ දී නැවත ඉදිකිරීම් ආරම්භ කර ඉදිකිරීම් කටයුතු 100% ක් අවසන් කරන ලදි. ඇස්තමේන්තුගත මුදල රු.මිලියන 3.07 ක් වන මෙම ව්‍යාපෘතිය සඳහා මෙම වසරේ වැයකල මුදල රුපියල් මිලියන 0.97 කි. අවසන් බිල්පත් සඳහා ගෙවීම් කිරීමට නියමිතය. මෙම මාර්ගය ඉදිකිරීම තුලින් සෘජුවම කෘෂිකාර්මික ප්‍රතිලාභීන් 620 ක් පමණ ජනතාවකගේ එදිනෙදා ගමනාගමන කටයුතුවලට විශාල පහසුවක් සැලසෙන අතර කන්ද උඩරට ඓතිහාසික ලංකාතිලක රජමහා විහාරස්ථානයට පැමිණෙන දහස් ගණනක් වූ දෙස් විදෙස් සංචාරකයින්ගේ ගමන් පහසුවද මෙමගින් සැළසෙනු ඇත. ඒ අනුව මෙය ප්‍රදේශයේ කෘෂිකාර්මික ජනතාවගේ යටිතල පහසුකම් සංවර්ධනයට මෙන්ම සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධනයට ද විශාල රුකුලක් වනු ඇත. මෙම ව්‍යාපෘතිය 2013 පෙබරවාරි මාසයේ දී උඩුනුවර ප්‍රාදේශීය සභාව වෙත භාර දීමට නියමිතව ඇත.

**4. කොත්මලේ නව තිස්පනේ බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉතිරි ඉදිකිරීම නිම කිරීම**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හරංගල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් 2007 වසරේ ආරම්භ කර ඇතත් එහි සියළු ඉදිකිරීම් අවසන් කර නොතිබීම හේතුවෙන් 2011 වර්ෂයේ දී අප අධිකාරිය විසින් නැවත ආරම්භ කරන ලදි. නමුත් එම වසර තුල සියළුම ඉදිකිරීම් අවසන් කිරීමට නොහැකි වූ අතර 2012 වර්ෂයේ දී සියළු ඉදිකිරීම් අවසන් කර ඇත. මෙහි ඇස්තමේන්තු මුදල රු. මිලියන 1.19 ක් වන අතර මෙම බහුකාර්ය ගොඩනැගිල්ල මගින් ප්‍රදේශයේ පාසැල් දරු දැරියන්ට අධ්‍යාපන කටයුතු සඳහා පරිඝනක මධ්‍යස්ථානයක් පවත්වා ගැනීමටත්, මහජන පුස්තකාලයක් පවත්වා ගැනීමටත්, අවශ්‍ය ගොඩනැගිලි පහසුකම් සලසා දීමට අධිකාරියට හැකිවිය. එය පළාතේ දරු දැරියන්ගේ මෙන්ම ජනතාවගේද අධ්‍යාත්මික සංවර්ධනය නගා සිටුවීමට මහගු පිටුවහලක් වනු ඇත. මෙම ගොඩනැගිල්ල 2013 ජනවාරි මාසයේ දී කොත්මලේ ප්‍රාදේශීය ලේකම් වෙත පවරාදීමට නියමිතව ඇත.



පෙර පැවති තත්වය



වැඩ නිම කළ ගොඩනැගිල්ල

**5. කොත්මලේ මාවෙල ප්‍රජාශාලා ගොඩනැගිල්ලේ ඉතිරි ඉදිකිරීම් නිම කිරීම**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාවෙල නැගෙනහිර වසමේ ඉදිකිරීමට ආරම්භ කර තිබූ මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ද සම්පූර්ණයෙන්ම නිම කර නොතිබීම හේතුවෙන් 2011 වර්ෂයේ දී නැවත ආරම්භ කළ නමුත් අයහපත් කාළගුණික තත්වයන් හේතුවෙන් එම වසරේදී ඉදිකිරීම අවසන් කිරීමට නොහැකි විය. ඒ අනුව 2012 වර්ෂයේ දී මෙහි ජල පහසුකම්, වැසිකිළි පහසුකම් සහ ආරක්ෂිත බැම්මක් සමග වැටක් ඇතුළුව සියළු ඉදිකිරීම් අවසන් කරන ලදි. මෙමගින් ප්‍රදේශයේ 950 ක් පමණ වූ ප්‍රතිලාභී ජනතාවට සමිති සමාගම් පැවැත්වීම මෙන්ම දරුවන් වෙනුවෙන් ඉතාමත් ආරක්ෂිත අයුරින් සහ ප්‍රියමනාප අයුරින් පෙර පාසල් කටයුතු පවත්වා ගෙන යාමට විශාල පහසුවක් සැලසී ඇත. මෙහි ඇස්තමේන්තු මුදල රු. මිලියන 1.30 ක් වේ. 2013 ජනවාරි මාසයේ දී මෙය කොත්මලේ ප්‍රාදේශීය ලේකම් වෙත පවරාදීමට නියමිතව ඇත.



පෙර පැවති තත්වය



නවීකරණය කළ ප්‍රජා ශාලාව

**6. කොත්මලේ මල්ලන්ද බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉතිරි ඉදිකිරීම් නිම කිරීම.**

නුවරඑළිය දිස්ති5ක්කයේ කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මල්ලන්ද වසමේ ඉදිකිරීමට ආරම්භ කර තිබූ මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ද අවසන් කර නොතිබීම හේතුවෙන් 2011 වර්ෂයේ දී නොනිමි ව්‍යාපෘති ඉදිකිරීම් අවසන් කිරීමේ වැඩසටහන යටතේ නැවත ආරම්භ කරන ලදි. එම වර්ෂයේ දී සියළු ඉදිකිරීම් අවසන් කිරීමට නොහැකි වුවද 2013 ජනවාරි මාසයේ දී කොත්මලේ ප්‍රාදේශීය ලේකම් වෙත පවරාදීමට නියමිතව ඇත. ඇස්තමේන්තු මුදල රු. මිලියන 1.04 ක් වන අතර, මෙම වසරේ වැය කල මුදල රුපියල් මිලියන 0.82 කි. මෙමගින් ප්‍රදේශයේ ජනතාවගේ පොදු කටයුතු සඳහා ඒකරාශී වීමට ස්ථානයක් ලැබීමෙන් ඔවුන්ගේ පොදු කටයුතු සඳහා විශාල පහසුවක් සැලසෙනු ඇත එමෙන්ම සමෘද්ධි නිලධාරි කාර්යාලය, ග්‍රාම නිලධාරි කාර්යාලය, පවුල් සෞඛ්‍ය සායන මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට ද මෙමගින් පහසුකම් සැලසී ඇත.



පෙර පැවති තත්වය



වැඩ නිම කළ ප්‍රජා ශාලාව

**7. අකුරණ සිත්තෝඩය පාලම ඉදිකිරීම සහ ප්‍රවේශ මාර්ගය කොන්ක්‍රීට් කිරීම**

මෙම ව්‍යාපෘතිය ද 2008 වර්ෂයේ දී ගම නැගුම වැඩසටහන යටතේ අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිකිරීම් ආරම්භ කර වැඩ අවසන් නොකළ ව්‍යාපෘතියකි. ඒ අනුව නොනිමි ව්‍යාපෘති ඉදිකිරීම් අවසන් කිරීමේ වැඩසටහන යටතේ 2011 වර්ෂයේ දී නැවත ඉදිකිරීම් ආරම්භ කරන ලදි. ඇස්තමේන්තුගත මුදල රු. මිලියන 3.20 ක් වන මෙහි 2011 වසර අවසන් වන විට ආරක්ෂිත පැතිබැම් ඉදිකිරීම ඇතුළුව ව්‍යාපෘතියට අදාලව පිවිසුම් මාර්ගයේ ඉදිකිරීම් කටයුතු 35% ක් පමණ අවසන් කරන ලදි. එහෙත් අප අධිකාරිය විසින් ඉදිකිරීම් පරීක්ෂාවන් සඳහා පත් කරන ලද වරලත් ඉංජිනේරු කමිටුව මගින් සිදු කරන ලද පරීක්ෂාවේ දී පාලම ඉදිකිරීම සඳහා අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අධීක්ෂණය යටතේ යොදා තිබූ අත්තිවාරම් මෙම පාලම ඉදිකිරීමට නුසුදුසු තත්වයේ ඇති බවට අනාවරණය විය. ඒ අනුව මාර්ග සංවර්ධන අධිකාරිය වෙතින් සහ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් පාලමට අදාලව නව සැලසුම් හා ඇස්තමේන්තු සකස් කරවා ගැනීමට පියවර ගන්නා ලදි. එම ආයතන විසින් ඇස්තමේන්තු සකස් කර අප වෙත ලබා දීම ප්‍රමාදවීම හේතුවෙන් 2012 වර්ෂය තුළ මෙහි ඉදිකිරීම් නැවත ආරම්භ කිරීමට නොහැකි විය. එසේ වුවද ප්‍රතිලාභීන් 2475 ක් පමණ වන ජනතාවකට දෛනික ගමනාගමන කටයුතු සඳහා මෙන්ම ආගමික සිද්ධාන්ත වෙත යාමටද විශාල පහසුවක් සැලසෙන මෙම පාලමේ ඉතිරි ඉදිකිරීම් කටයුතු 2013 වර්ෂයේ දී ඉතා කඩිනමින් අවසන් කර ජනතාව වෙත පවරාදීමට නියමිතය.

## විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

**1. ගලගෙදර පොදුවැසිකිලි පද්ධතිය ඉදිකිරීම.**

ගලගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගලගෙදර නගරයේ පොදු වැසිකිලි පද්ධතියක දැඩි අවශ්‍යතාවයක් තිබිණි. ප්‍රධාන බස් නැවතුම් පොල, රෝහල, උසාවිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පාසැල් ඇතුළු රාජ්‍ය ආයතන සහ වෙළඳ ව්‍යාපාර රැසක් ද නගරය කේන්ද්‍ර කොටගෙන ඇත. මේ නිසා විශාල ජනතාවක් දෛනිකව නගරයට රැස්වේ. එකී ජනතාව සඳහා නගරයේ තිබූ එකම වැසිකිලි පද්ධතියද අබලන්ව කඩා වැටී තිබූ අතර, භාවිතයට ගත නොහැකි තත්වයේ පැවතිණ. එමෙන්ම එය මහජන සෞඛ්‍ය සඳහා විශාල තර්ජනයක් ද වී තිබිණි. මේ නිසා ජනතාවගේ ඉල්ලීමත් ප්‍රාදේශීය දේශපාලන අධිකාරියේ ඉල්ලීමත් සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව ඉතාමත් සනීපාරක්ෂක ලෙස නවීණ අයුරින් පොදු වැසිකිලි පද්ධතියක් ඉදිකිරීමට අධිකාරිය විසින් පියවර ගන්නා ලදි. මෙය 2012 වර්ෂයේ දී මාස 03 ක් වැනි කෙටි කාලයකින් රුපියල් මිලියන 1.28 ක වියදමින් සාදා නිමකර තුම්පනේ ප්‍රාදේශීය සභාව වෙත පවරා ජනතාවගේ භාවිතය සඳහා ලබාදෙන ලදි. මෙමගින් ගලගෙදර නගරයට විශාල අඩුපාඩුවක්ව තිබූ සනීපාරක්ෂක වැසිකිලි පද්ධතියක් ඉදිකර දීමට අධිකාරියට හැකිවිය.



පෙර පැවති තත්වය



වත්මන් තත්වය

**2. කඩුගන්නාව නගරයේ පොදු වැසිකිලි පද්ධතිය ඉදිකිරීම.**

කන්ද උඩරට පිවිසුම් දොරටුව වශයෙන් සැලකෙන කඩුගන්නාව නගරයටද පොදුවැසිකිලි පද්ධතියක අවශ්‍යතාවය දැඩිව උද්ගත වී තිබිණ. දෛනිකව නගරයට පැමිණෙන ප්‍රදේශයේ ජනතාවට මෙන්ම බස් නැවතුම්පල වෙත සහ වෙළඳපොල වෙත පැමිණෙන ජනතාවට ද දුර බැහැර සිට නගරයට පැමිණෙන මගී ජනතාවට ද විදේශීය සංචාරකයින්ට ද වැසිකිලි හා කැසිකිලි පහසුකම් සපයා ගැනීමේ ධී දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදුවී තිබිණි. ඒ අනුව කඩුගන්නාව නගර සභාවේ ඉල්ලීමද දේශපාලන අධිකාරියේ ඉල්ලීමද පොදු ජනතාවගේ ඉල්ලීම් ද සැළකිල්ලට ගනිමින් රුපියල් මිලියන 2.45 ක් වැය කරමින් නවීන සනීපාරක්ෂකද වැසිකිලි පද්ධතියක් ඉදිකර දීමට 2012 වර්ෂයේදී අප අධිකාරියට හැකිවිය. මෙය විදේශීය සංචාරකයින්ට මෙන්ම ආබාධිත පුද්ගලයින්ට ද භාවිතා කිරීමේ පහසුකම් සහිතව නගරයේ අලංකාරයටද ගැලපෙන අයුරින් ඉතාමත් නවීන අකාරයට ඉදිකර ඇත. මෙම වැසිකිලි පදධතිය ඉදිකිරීමෙන් අනතුරුව එය සනීපාරක්ෂක අයුරින් පවත්වාගෙන යාමටත් නඩත්තු කිරීමටත් 2013 ජනවාරි මාසයේ දී කඩුගන්නාව නගර සභාව වෙත පවරා දීමට නියමිතව ඇත.





කඩුගන්නාව පොදු වැසිකිලි පද්ධතිය

# විගණකාධිපති වාර්තාව

## විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No } සීඑල්/කේඩී/එච්/යූඩීඒ/2012-එෆ්ඒ/2013/55

ඔබේ අංකය / உமது இல / Your No. }

දිනය / திகதி / Date } 2014 ජනවාරි 23 දින

Department of Divineguma Development
දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
05 FEB 2014
අංක 1120, ... පේරාදෙණිය.

සභාපති,

ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය.

ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 26 දරන ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය පනතේ 25 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2013 අගෝස්තු 26 දින නිකුත් කරන ලදි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

---

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone } 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. } 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. } oaggov@sltnet.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබද ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සදහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරි බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට උඩරට සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ප්‍රතිපත්ති සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයෙන් 2006 අගෝස්තු 06 දින පරිත්‍යාග ලෙස ලැබී තිබුණු 2012 දෙසැම්බර් 31 දිනට තක්සේරු වටිනාකම රු.500,000 ක් වූ වාහනයේ වටිනාකම උසස් ගිණුම්කරණ පරිචයන්ට අනුව මෝටර් රථ හා රාජ්‍ය ප්‍රදාන යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරියේ වාහනයක් අළුත්වැඩියා කිරීම සඳහා 2008 අගෝස්තු 25 දින වැයකළ රු.113,977ක් දේපල පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කිරීම නිසා එම ප්‍රමාණයෙන් දේපල පිරියත හා උපකරණ අගය වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2010 දෙසැම්බර් 31 දින මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ලැබිය යුතු වක්‍රීය අරමුදලේ වූ රු.6,382,743ක ශේෂය සඳහා 2011 හා 2012 වර්ෂවලදී සිදුව තිබූ ගනුදෙනුවලට අදාල ගැලපීම් සිදු කිරීමෙන් පසුව 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.8,535,592ක් වී තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එම ශේෂය රු.160,724ක් අඩුවෙන් රු.8,374,868ක් ලෙස දක්වා තිබුණි.

(ඇ) ශේෂ පත්‍රයේ දක්වා තිබුණු රු.8,177,224ක ස්ථාවර තැන්පතු ශේෂය තුළ 2013 ජනවාරි 15 දින තැන්පත් කරන ලද රු.501,115ක් වූ ස්ථාවර තැන්පතුවක වටිනාකමද ඇතුළත් කර තිබුණු බැවින් ස්ථාවර තැන්පත් වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

චක්‍රීය අරමුදල සඳහා ප්‍රතිලාභීන්ගෙන් ලැබිය යුතු රු.8,374,868ක් තහවුරු කර ගැනීම සඳහා ණයගැති ශේෂ තහවුරු කිරීමේ ලිපි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

මුදල් රෙගුලාසි 882 ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුව ඇප තැබිය යුතු තනතුරක වැඩ බැලීම සඳහා පත්කරනු ලබන නිලධාරීන්ද, තමා ස්ථිරවම එම තනතුරට පත්කරනු ලැබූවකු ලෙස සලකමින් ඇප තැන්පත් කළයුතු වුවත්, වැඩ බැලීම සඳහා පත්කළ නිලධාරීන් දෙදෙනෙකු විසින් එකතුව රු.30,000ක ඇප තබා නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතුවලින් රු.38,770,251ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු.5,679,287ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.44,449,538ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. මෙම පිරිහීමට පෙර වර්ෂයේ කාර්ය සාධන අවශ්‍යතා ඉක්මවා භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලබාගැනීම සහ සමාලෝචිත වර්ෂයේ සංවර්ධන කටයුතු සඳහා ප්‍රමාණවත් පරිදි අග්‍රිම නොලැබීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පසුගිය වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ ශුද්ධ ජංගම වත්කම් රු.මිලියන.42.4ක් හෙවත් සියයට 66කින්ද, ශුද්ධ වත්කම් රු.මිලියන 44.9ක් හෙවත් සියයට 49කින්ද, අඩුවී තිබුණු අතර ශේෂ පත්‍ර දිනට සමුච්චිත අරමුදලේ ශේෂයද රු.මිලියන 38.7ක් හෙවත් සියයට 65කින් අඩුවී තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා මූලධන ප්‍රතිපාදන ලැබී නොතිබූ නමුත් රු.34,362,613ක සංවර්ධන වැඩ කර තිබීම මෙම මූල්‍ය ප්‍රතිඵල පැන නැගීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන අංශ 03 ක් යටතේ පසුගිය වර්ෂයේ බැදීම්ගත හා අව්ච්ඡේද කරන ලද ඒකක 237කින් සමන්විත සංවර්ධන කාර්යයන් ඉටු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 50.1ක ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම ඇස්තමේන්තුගත වියදමෙන් රු.මිලියන 30.34ක් හෙවත් සියයට 61ක ප්‍රතිශතයක් පමණක් උපයෝගී කර තිබුණි. මීට අමතරව සමාලෝචිත වර්ෂය තුළදී සැලසුම් නොකළ රු.34,362,614ක කාර්යයන් ඉටුකර තිබුණි.

(ආ) ජීවනෝපාය හා අධ්‍යාත්මික කඩිනම් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03ක් තුළ තෝරාගත් ප්‍රතිලාභීන් 413 දෙනෙකු සඳහා රු.5,194,796ක් වටිනා වැසිකිළි උපකරණ මිලදී ගෙන බෙදා දී තිබුණි. මේ සම්බන්ධයෙන් ප්‍රතිලාභීන් 26 දෙනෙකුට අදාලව සිදු කරන ලද නියැදි පරීක්ෂාවකට අනුව වැසිකිළි 02ක් පමණක් ඉදිකර තිබුණු අතර, එහි ප්‍රතිශතය සියයට 08ක් පමණ විය. ඒ අනුව එක් අයෙකු වෙනුවෙන් රු.12,578ක් බැගින් වැසිකිළි උපකරණ කට්ටල 24ක් සඳහා රු.301,872ක් වටිනා ද්‍රව්‍ය භාවිතයට ගෙන නොතිබීම සහ වැසිකිළි ඉදි නොකළ ඇතැම් ප්‍රතිලාභීන් එම ද්‍රව්‍ය විකුණා තිබීම නිසා ව්‍යාපෘතිය මඟින් ඵලදායී කාර්ය සාධනයක් අත්පත් කර ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) 2011 වර්ෂයේ ජීවනෝපාය සංවර්ධන(සත්ව පාලන) ව්‍යාපෘතියේ චක්‍රීය අරමුදල් වැඩසටහන යටතේ ගව පාලන ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී තෝරාගත් ප්‍රතිලාභීන් වෙත කිරි ගවයින් 52ක් ලබාදී තිබුණ අතර, එසේ ලබාදී වර්ෂයක් ගතවීමට පෙර, ගවයන් 06 දෙනෙකු විවිධ හේතුන් මත මියගොස් තිබුණි. මියගිය සතුන් සහ ඊට අදාල ගවගාල් සඳහා අධිකාරිය විසින් දරන ලද වියදම රු.507,291ක් වුවත් රක්ෂණ වන්දි වශයෙන් ලැබී තිබුණේ රු.40,000ක් පමණි.

(ඇ) ජාතික සවිය හා ගම නැගුම ජීවනෝපාය සංවර්ධන වැඩසටහනේ 2008/2009 ප්‍රතිපාදන යොදා ගනිමින් එළකිරි පානය ප්‍රචලිත කිරීමේ ජාතික වැඩසටහන යටතේ අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමියේ රු.587,427ක වියදමින් 2010 ජනවාරි 01 දින සිට මාස 20ක පමණ කාලයක් කිරිහලක් පවත්වා ගෙන ගොස් තිබුණි. 2011 සැප්තැම්බර් 30 දින සිට එය වසා දමා ගොඩනැගිල්ල සහ ඊට අදාළ උපකරණ ප්‍රාදේශීය ලේකම් වෙත පවරා තිබූ අතර එම ගොඩනැගිල්ල සහ උපකරණ එදින සිට 2013 අප්‍රේල් 30 දක්වා නිෂ්කාර්යව පැවතුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

2007 නොවැම්බර් මස සිට 2011 ජූලි මස දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නියමිත දිනට නොගෙවීම නිසා රු.848,429ක දඩ මුදලක් ගෙවීමට සිදුව තිබුණු අතර, එම දඩ මුදල වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගෙන නොතිබුණි.

4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන හා මුදල්) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබූ නිලධාරිනියක 2012 නොවැම්බර් 07 දින සිට එම තනතුරට උසස් කර එදින සිට 2013 මැයි 31 දින වන විට රු.368,203ක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි.

(ආ) අධිකාරියේ තනතුරු 18කට අදාලව අනුමත සේවක සංඛ්‍යාව 50ක් වූ අතර, එම තනතුරු සඳහා ස්ථිර පදනම මත සේවකයින් 40ක්, කොන්ත්‍රාත් පදනම මත සේවකයන් 04ක්, දෛනික පදනම මත සේවකයන් 03ක් හා සේවා මිලදී ගැනීම් පදනම මත සේවකයන් දෙදෙනෙකු සමග සේවකයන් 49 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

### 4.4 වාහන උපයෝජනය

ආයතනය සතුව පැවති වාහන 03ක් 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා නිෂ්ක්‍රියව පැවතුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන

අධිකාරිය විසින් පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන, කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය සඳහා විගණිත දිනය වූ 2013 ජූලි 19 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණු අතර අධිකාරිය ආරම්භ කර තිබූ 2006 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ මූල්‍ය ප්‍රකාශන, කළමනාකරණ මණ්ඩලයේ සමාලෝචනයට හා අනුමැතියට භාජනය කිරීමකින් තොරව විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

### 5.2 සංයුක්ත සැලැස්ම

අධිකාරිය විසින් 2008 සිට 2012 දක්වා පස් අවුරුදු කාලයකට අදාලව සංයුක්ත සැලැස්මක් උප වැඩ කොටස් 95කින් යුක්තව සකස් කර තිබුණද, එම සැලැස්ම කාලානුරූපව සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණි. සංයුක්ත සැලැස්මෙහි අරමුණුගත කාර්යයන්ගෙන් ඉටු කර තිබුණේ උප වැඩ ඒකක 19ක්, එනම් සියයට 20ක් තරම් ප්‍රමාණයකි. ඒ අනුව උප වැඩ ඒකක 76ක් එනම් සියයට 80ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

### 5.3 අභ්‍යන්තර විගණනය

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

5.4 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ප්‍රසම්පාදන සැලැස්ම තාත්වික පදනමෙන් යුතුව පිළියෙලකර නොතිබුණු අතර එම සැලැස්ම යාවත්කාලීන කිරීමට හෝ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

5.5 අයවැය ඇස්තමේන්තුව හා තත්‍ය වියදම අතර විචලනය

(අ) පුනරාවර්තන වැය විෂයයන් 09ක ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එම වැය විෂයයන් සඳහා සියයට 19 සිට සියයට 257 දක්වා පරාසයන් තුළ රු.1,574,552ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයන්ගෙන් මාරුකර තිබුණි.

(ආ) පුනරාවර්තන වැය විෂයයන් 11ක රු.1,608,756ක ප්‍රතිපාදන ඉතිරිවී තිබූ අතර, එම ඉතිරි ප්‍රතිපාදන සියයට 11 සිට සියයට 100 දක්වා වෙනත් වැය විෂයන්ට මාරු කර තිබුණි.

6. පද්ධති හා පාලන

විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන ක්ෂේත්‍ර පිළිබඳ ඌනතා වරින් වර සභාපතිවරයා දැනුවත් කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
(ආ) චක්‍රීය අරමුදල් වැඩසටහන
(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඈ) ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති අරමුණු ගතව මෙහෙයවීම
(ඉ) ගිණුම්කරණය

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති